# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023(2024)

| විෂය අංකය<br>பாட இலக்கம் | 23 | විෂයය<br>பாடம் | දේශපාලන විද්‍යාව |
|---|---|---|---|

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 5 | 21. | 2 |
| 02. | 3 | 12. | 1 | 22. | 1 |
| 03. | 34 | 13. | 3 | 23. | 5 |
| 04. | 2 | 14. | 1 | 24. | 3 |
| 05. | 4 | 15. | 3 | 25. | 2 |
| 06. | 1 | 16. | 2/5 | 26. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 1 |
| 08. | 5 | 18. | 4 | 28. | 2 |
| 09. | 2 | 19. | 1 | 29. | 5 |
| 10. | 1 | 20. | 2 | 30. | 4 |

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 2 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள்
2× 30 = 60



Scanned with CamScanner

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024).**

**23 S I**

**B කොටස**

31. (1) ව්‍යවහාරික බුද්ධියේ කොටසක් ලෙස දේශපාලනය ඉගෙනීම
(2) විද්‍යාත්මක දැනුම පාදක කොට ගෙන දේශපාලනය ඉගෙන ගැනීම.

32. (1) සම්භාව්‍ය තුලනාත්මක ප්‍රවේශය (සාම්ප්‍රදායික ප්‍රවේශය)
(2) 20 වැනි සියවසේ තුලනාත්මක ප්‍රවේශය
සමකාලීන තුලනාත්මක ප්‍රවේශය (නූතන ප්‍රවේශය).

33. (1) ජීවිතය ආරක්ෂා කිරීම
(2) නිදහස ආරක්ෂා කිරීම /
දේපළ ආරක්ෂා කිරීම.

34. (1) සර්වජන ඡන්ද බලය/ කාලානුරූපී, නිදහස් හා සාධාරණ මැතිවරණ.
(2) පොදු කැමැත්ත
ජනතාවට වගවීම
විවෘත තරගය
සීමිත ආණ්ඩුව
ස්වාධීන අධිකරණය
ප්‍රතිචාරාත්මක බව/ විනිවිදභාවය/ ව්‍යවස්ථානුකූලවාදය/ සුළුතර ජන කොටස්වල අයිතිවාසිකම්/පෞද්ගලික දේපළ/නිදහස් වෙළෙඳපොළ/ සංවරණ සහ තුලන/නීතියේ ආධිපත්‍යය.
**(සහකාර පරීක්ෂකවරුන්හට අතිරේක, සුදුසු පිළිතුරු, පිළිබඳ ප්‍රධාන පරීක්ෂකවරුන්ගෙන් උපදෙස් ලබා ගත හැක).**

35. (1) දේශපාලන බලය අල්ලා ගැනීමට සහ ආණ්ඩු බලය පාලනය කිරීමට දේශපාලන පක්ෂ සංවිධානය වී ඇත.
(2) දේශපාලන පක්ෂවලට ස්ථාවර සාමාජිකත්වයක් ඇත.
දේශපාලන පක්ෂ සතුව ප්‍රතිපත්ති රාමු පවතී
දේශපාලන පක්ෂවලට මතවාදී අනන්‍යතා ඇත.
සමාජ ව්‍යාපාර මහජන ක්‍රියාකාරීත්වය සමඟ විචලනය වේ.
පක්ෂවලට විධිමත් සංවිධාන ව්‍යුහයක් ඇති අතර සමාජ ව්‍යාපාරවලට එසේ තිබීම අත්‍යවශ්‍ය නැත.
සමාජ ව්‍යාපාර වඩාත් නිශ්චිත අභිලාශ ආමන්ත්‍රණය කරන අතර දේශපාලන පක්ෂ පුළුල් සහ විස්තෘත දැක්මක් සහිත වේ.

36. (1) සමාජ පුරවැසිභාවය /
(2) දේශපාලන පුරවැසිභාවය
සිවිල් පුරවැසිභාවය.

37. (1) කාල් මාක්ස්
(2) ෆ්‍රෙඩ්රික් එංගල්ස්.

38. (1) එඩ්වඩ්/ එදුවාඩ් බර්න්ස්ටයින් /
(2) ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය.

39. (1) ඒකබලවාදය (totalitarianism)
(2) රාජ්‍යය පරමෝත්තම කොට සැලකීම /
නායක අභිවන්දනය/ අන්ත මිලිටරිවාදය/ උග්‍ර වර්ගවාදය/ ප්‍රචණ්ඩත්වය සහ භීෂණය දේශපාලන අවි ලෙස භාවිත කිරීම.

40. (1) ලිබරල් ස්ත්‍රීවාදය
(2) රැඩිකල් ස්ත්‍රීවාදය /
සමාජවාදී ස්ත්‍රීවාදය/ මාක්ස්වාදී ස්ත්‍රීවාදය/ පශ්චාත්-නූතන ස්ත්‍රීවාදය/ පශ්චාත් ව්‍යුහවාදී ස්ත්‍රීවාදය/ පශ්චාත් යටත් විජිත ස්ත්‍රීවාදය/ කළු ස්ත්‍රීවාදය. /



Scanned with CamScanner

41. (1) පවතින රාජ්‍යයක මිනිසුන් නව භූමියක් ගවේෂණය කොට, එහි පදිංචි වී මව් රාජ්‍යයේ දේශපාලන, ආර්ථික හා සමාජීය පද්ධති ආදේශ කොට, එම නව සමාජය මව් රටෙහි පාලනය යටතට පත් කර ගැනීම.
 (2) බලවත් රාජ්‍යයක් දැනටමත් ජනාවාස භූමි ප්‍රදේශයක් ගිවිසුමක් මගින් හෝ යුද්ධයක් මගින් යටත් කර ගෙන එහි විජිත පාලනය ස්ථාපිත කිරීම.

42. (1) 1947
 (2) 1972.

43. (1) ඩොමීනියන් තත්ත්වය සහ බ්‍රිතාන්‍ය නීති සම්ප්‍රදාය අඛණ්ඩව පවත්වාගෙන යාම.
 (2) පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය නොමැතිකම.
 ජනරජයක් සඳහා වූ අපේක්ෂා.
 පරිපූර්ණ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් නොමැති වීම.
 රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව සම්බන්ධ ගැටලු.
 අභියාචනා සම්බන්ධයෙන් ප්‍රිවි කවුන්සිලයේ බලය.
 සෙනෙට් සභාව පිළිබඳ විවේචන.

44. (1) මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ අන්තර්ගතයේ ගැටළු සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා නීතිමය පිළියම් නොමැති වීම.
 (2) ජාතික රාජ්‍ය සභාව මගින් දැඩි දේශපාලන අධිකාරී බලයක් භාවිතා කිරීම.
 අධිකරණය සහ රාජ්‍ය සේවය මත වූ විධායකයේ පාලනය.
 දේශපාලන ආයතනවල අධිකාරීමය ලක්ෂණ (උදා: අගමැතිවරයා සතු බලය)
 සුළුතර අයිතිවාසිකම් සුරැකීම සඳහා වූ විධිවිධාන ඉවත් කිරීම.
 දුර්වල ව්‍යවස්ථාමය බලය (අධිකරණ සමාලෝචන බලය ව්‍යවස්ථාවට සැරසීමක් පමණි).
 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේදී ජනතාවගේ කැමැත්ත නොසැලකීම.

45. (1) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය.
 (2) පාර්ලිමේන්තුවේ, සැසිවාර සඳහා සම්බන්ධ වීමේ හා ඇමතීමේ / වාරාවසාන කිරීමේ බලය.
 පාර්ලිමේන්තුවේ බහුතර බලයට යටත් නොවී සිටීමේ හැකියාව.
 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සමහර නීති සම්බන්ධයෙන් ජනමත විචාරණයක් ඉල්ලා සිටීමේ බලය.
 හදිසි නීති රෙගුලාසි භාවිතයෙන් පාර්ලිමේන්තුවේ නීති අභිබවා යාමට ඇති බලය.

46. (1) ප්‍රතිමානීය විමර්ශනය
 (2) විද්‍යාත්මක/ ආනුභවික විමර්ශනය

47. (1) නියෝජනය
 (2) දේශපාලන ප්‍රභූන් නිර්මාණය කිරීම සහ බඳවා ගැනීම
 දේශපාලන ඉලක්ක තීරණය කිරීම.
 අභිලාශ එක් රැස් කිරීම සහ හැඩ ගැස්වීම.
 ජනතාව ජාංගමනය කිරීම (බලමුලු ගැන්වීම) සහ නායකත්වය සැපයීම
 ආණ්ඩුවේ කටයුතු සංවිධානය කිරීම.

48. (1) මූල්‍ය හදිසි අවස්ථාව
 (2) ජාතික හදිසි අවස්ථාව
 ප්‍රාන්ත හදිසි අවස්ථාව

49. (1) දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංගමය/ සංවිධානය - SAARC
 (2) පොදුරාජ්‍ය මණ්ඩලය
 එක්සත් ජාතීන් - UN / නොබැඳි ව්‍යාපාරය - NAM / ඉන්දියානු සාගර වටද්දර කලාපීය සංවිධානය - IORA/ බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත මුලපිරීම -BIMSTEC

50. (1) දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය/ ගිවිසුම - SAFTA



Scanned with CamScanner

(2) දකුණු ආසියාතික වරණාත්මක වෙළෙඳ ගිවිසුම - SAPTA

[illegible] Tax free

- [illegible]
- [illegible]



Scanned with CamScanner

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය , 2023 (2024)

## 23 - දේශපාලන විද්‍යාව

## 23 - S – II

### I කොටස

**1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය විග්‍රහ කරන්න.**

ප්‍රශ්නයේ මූලික අපේක්ෂාව (keyword) වන්නේ "විස්තර කරන්න" යනුය. එයින් හැඟවෙන්නේ අපේක්ෂකයාගේ දේශපාලන ප්‍රපංචය ගැන විස්තර දැක්වීමට ඇති හැකියාව මැන බැලීමට හා දේශපාලන විද්‍යාව යටතේ හදාරන විෂය ගැන ඇති අවබෝධය මැන බැලීමයි.

අපේක්ෂකයා ප්‍රශ්නයට උත්තර සැපයීමේ දී හැඳින්වීමක් ඉදිරිපත් කිරීමක් කළ හැකිය (ලකුණු 03. කෙසේ වුවත් පිළිතුරු පත්‍ර පරීක්ෂකවරයා ස්වකීයමය වූ විෂය මූලික තීන්දුවක් හැඳින්වීම සම්බන්ධයෙන් ගත යුතු අතර මේ ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ විෂය සම්බන්ධයෙන් ඇති දැනුම මැන බැලීම බව දැනුවත් කරනු ලැබේ).

**හැඳින්වීම: (ලකුණු 03).**

දේශපාලනය පිළිබඳ පොදුවේ එකඟ වූ නිර්වචනයක් නොමැත. එය රාජ්‍යයේ කටයුතු, ආණ්ඩු කිරීමේ කලාව, ගැටුම් නිරාකරණය, බල අරගලය යනාදියට සමාන්තරව අර්ථ දක්වා ඇත. කෙසේ වෙතත්, එම නිර්වචන තුළ මූලික වශයෙන් අවධාරණය කර ඇති කාරණා සහ ක්‍රියාවලි දක්නට ලැබේ. නිදසුනක් වශයෙන්, දේශපාලනය රාජ්‍යයේ කටයුතු ලෙස හෝ බල අරගල ලෙස අර්ථ දැක්වීම දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීමක් වන අතර ඇතැම් නිර්වචන දේශපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලිය අවධාරණය කරයි.

විද්‍යාත්මක අධ්‍යයනයක් යනු දේශපාලනය ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමයි. මෙම සන්දර්භය තුළ විෂය ක්ෂේත්‍රය මගින්, එලෙස දේශපාලන විද්‍යාව විසින් විද්‍යාත්මකව අධ්‍යයනය කරන දේ සඳහන් කරයි. සමාජ ක්‍රියාකාරකම්වල සෑම ක්ෂේත්‍රයකම දේශපාලනය දක්නට ලැබෙන බැවින්, දේශපාලනය හදාරන්නෙකුට අධ්‍යයනය කළ හැකි පුළුල් පරාසයක මාතෘකා තිබේ. දේශපාලන විද්‍යාව යනු මිනිසාගේ සමාජ ජීවිතය සමඟ නොවැළැක්විය හැකි ලෙස බැඳී ඇති දේශපාලන සංසිද්ධි අධ්‍යයනය කිරීම බව සාර්ථක පිළිතුරක් විසින් ඉස්මතු කරනු ලැබිය යුතුය.

දේශපාලනය යන අදහස ගවේෂණය කරන විට එහි මූලික, අන්තර් සම්බන්ධිත අර්ථ දෙකක් ඇති බව අපට පෙනේ

- රාජ්‍යයට, ආණ්ඩුවේ පරිපාලනයට සහ ආණ්ඩුකරණයට අදාළ ක්‍රියාකාරකම් සඳහන් කරන සංකල්පයක් ලෙස, සහ
- සෘජුවම රාජ්‍ය පරිමණ්ඩලයෙන් පිටත පුරවැසියන් අතර ක්‍රියාත්මක සමාජ භාවිතයක් ලෙස, යනු වශයෙනි.

**අන්තර්ගතය (ලකුණු 15).**

**දේශපාලන විද්‍යාවේ ස්වභාවය.**

සරල අර්ථයකින් දේශපාලන විද්‍යාව යනු අපගේ සමාජ ජීවිතයේ ප්‍රධාන මානයක් වන දේශපාලනය අධ්‍යයනය කරන ශාස්ත්‍රීය ශික්ෂණය ලෙස අර්ථ දැක්වේ.

දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයට දිගු ඉතිහාසයක් ඇත. දේශපාලනය ක්‍රමානුකූලව හැදෑරීමේ පැරණිතම ශාස්ත්‍රීය සම්ප්‍රදාය කීර්තිමත් ග්‍රීක දාර්ශනිකයන් වන ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් විසින් ආරම්භ



Scanned with CamScanner

කර වර්ධනය කරන ලදී. වර්තමානයේ පාසල්වල සහ විශ්වවිද්‍යාලවල දේශපාලන විද්‍යාව විෂයයක් ලෙස ඉගැන්වීම මෙම සම්භාව්‍ය සම්ප්‍රදායේ අඛණ්ඩ පැවැත්මයි.

දේශපාලන විද්‍යාවේ දේශපාලනය හැදෑරීම යන්න තුළ අර්ථ කිහිපයක් ඇත. දේශපාලනය සහ එහි විවිධ පැතිකඩ අධ්‍යයනය කිරීම, විශ්ලේෂණය කිරීම සහ පර්යේෂණ පැවැත්වීම, පවතින දේශපාලන න්‍යායන් විවේචනය කිරීම, නව න්‍යායන් සහ සංකල්ප ගොඩනැගීම, පවතින රාජ්‍ය ප්‍රතිපත්ති විවේචනය කිරීම සහ විකල්ප යෝජනා කිරීම සහ පුරවැසියන් මෙන්ම දේශපාලනයේ නියැලෙන්නන් පුහුණු කිරීම සඳහා කුසලතා ඉගෙනීම ඇතුළත් වේ. අදටත් පාසල්වල සහ විශ්වවිද්‍යාලවල දේශපාලන විද්‍යාව ඉගැන්වීමේ න්‍යාය පත්‍රය තුළ ඇත්තේ මෙම අරමුණුය.
දේශපාලන විද්‍යාවේ ස්වභාවය අවබෝධ කර ගැනීමේදී අපට මතක තබා ගත යුතු ප්‍රයෝජනවත් මූලික කරුණු කිහිපයක් තිබේ.

- දේශපාලන විද්‍යාව පැරණිතම ශාස්ත්‍රීය විෂයයන්ගෙන් එකකි. ක්‍රි.පූ. 5 - 4 වැනි සියවස්වල පමණ සම්භාව්‍ය ග්‍රීසියේ දර්ශනවාදය, ගණිතය, තර්කය, ආචාර විද්‍යාව සහ සෞන්දර්යවේදය සමඟ දේශපාලන විද්‍යාව පරිණාමය විය.
- දේශපාලන විද්‍යාවේ ස්වභාවය, විෂය පථය, අන්තර්ගතය, ක්‍රම, න්‍යායන්, සංකල්ප සහ ප්‍රවේශයන් සියවස් ගණනාවක් තිස්සේ වර්ධනය සහ පරිනාමය වී ඇත.
- දේශපාලන විද්‍යාවේ ප්‍රවේශයන්, න්‍යායන් සහ සංකල්ප විවිධ මෙන්ම බහුවිධ වේ. ඒවා විවිධ සම්ප්‍රදායයන් මෙන්ම ගුරුකුල ලෙස ද හඳුනාගෙන ඇත. මෙම විවිධත්වය සහ බහුවිධ බව දේශපාලනය පිළිබඳ අධ්‍යයනය සිත්ගන්නාසුළු හා උද්වේගකර වූවක් බවට පත් කරයි.

**විෂය ක්ෂේත්‍රය තුළ අවධානයට ලක් කෙරෙන මාතෘකා** රාජ්‍යය හා ආණ්ඩුව

- දේශපාලන බලය හා බල අරගලය
- දේශපාලන දර්ශනය
- දේශපාලන දෘෂ්ටිවාද/මතිමතාන්තර
- දේශපාලන න්‍යාය
- දේශපාලන සංස්ථා
- දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම්
- සිවිල් සමාජය
- තුලනාත්මක දේශපාලනය
- රාජ්‍ය ප්‍රතිපත්තිය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය පරිපාලනය
- ජාත්‍යන්තර දේශපාලනය සහ විදේශ ප්‍රතිපත්ති
- ගැටුම් සහ සාම අධ්‍යයනය

**(විවිධ පාඨග්‍රන්ත විෂය ක්ෂේත්‍රය විවිධාකාරයට විග්‍රහ කර තිබීම ගැන පරීක්ෂකවරුන්ගේ අවධානයට යොමු කරනු ලැබේ. අපේක්ෂකයා අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය ගැන ප්‍රමාණවත් අවබෝධයක් විදහා පාන්නේ නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කළ යුතුය.(යෝජිත ලකුණු 15).**

**නිගමනය (ලකුණ 2).**
අපේක්ෂකයා තාර්කිකව දේශපාලන විද්‍යාව් ගතික ස්වභාවය ගැන අවබෝධය විශද කරමින් හා දේශපාලන විද්‍යාව යටතේ හදාරන විවිධ ක්ෂේත්‍ර ගැන අවබෝධය පළ කරනනේ නම් ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබා දෙන ලෙස යොජනා කරනු ලැබේ.

---

**2. පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩුක්‍රම අතර වෙනස් කම් පැහැදිලි කරන්න.**

පිළිතුරු පත්‍ර පරීක්ෂකයන්ගේ අවධානයට මෙහි ඇති මූලික අපේක්ෂාව (keyword ගැටපදය) වන "පැහැදිලි කරන්න" යනු කෙරෙහි යොමු කරනු ලැබේ. ඉන් අදහස් වනනේ වෙනස්කම්වලට බලපාන කරුණු ගැන හේතු දැක් වීමට ඇති හැකියාවය .



Scanned with CamScanner

**හැඳින්වීම (ලකුණු 3 )**

අපේක්ෂකයා ස්වකීය පිළිතුර පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩුක්‍රම ආකෘති ගැන සම්බන්ධ හැඳින්වීමකින් ආරම්භ කළ හැකිය.

**අන්තර්ගතය (ලකුණු 15)**

**පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය**

පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දී ව්‍යවස්ථාදායකයට හා විධායකයට වෙන් වෙන් වූ පැවැත්මක් නැත.
ව්‍යවස්ථාදායකය හා විධායකය උත්පාදනය වන්නේ එකම මැතිවරණයකිනි. ව්‍යවස්ථාදායකයින් අතරින් බහුතරයක විශ්වාසය ලබාගන්නා පක්ෂය හෝ කණ්ඩායම ආණ්ඩුව පිහිටුවයි.
ව්‍යවස්ථාදායකයට ආණ්ඩුවත් ආණ්ඩුවට ව්‍යවස්ථාදායකයත් එකිනෙක පාලනය කළ හැකිය .
ආණ්ඩුව විසින් යෝජිත නිති පැනවීමේ යෙදෙන අතරම, පාර්ලිමේන්තුව කථිකා සභාවක්, එනම් ආණ්ඩුවේ ගුණ දොස් සාකච්ඡා කරන/සොයන සභාවක් වෙයි. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දී තනි තනි මන්ත්‍රීවරයාගේ වැදගත් කම අඩුවෙයි. ආණ්ඩුව විසින් යෝජිත නීති කෙටුම්පත්වලට තනි තනි මන්ත්‍රීවරයාගේ යෝජනාවලට වඩා ප්‍රමුඛතාව ලැබේ.
උත්සවකාර රාජ්‍ය නායකයකු හා ආණ්ඩුවේ තථ්‍ය නායකයෙකු සිටියි.
පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ආකෘතියේ දී සාමූහික වගකීම පිළිබඳ මූලධර්මය අතිශයින් වැදගත් වෙයි.
පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී ගුණයෙන් වැඩි වුවත් අඩුවෙන් ස්ථාවරයැයි කියනු ලැබේ.

**ජනාධිපති ආණ්ඩුක්‍රම ආකෘතිය**

ව්‍යවස්ථාදායකයට හා විධායකයට ඇත්තේ වෙන් වෙන් වූ පැවැත්මකි.
ජනාධිපතිවරයා හා ව්‍යවස්ථාදායකය තෝරා ගන්නේ වෙනම මැතිවරණවලිනි. ආයතන දෙකේ පැවැත්ම වෙන වෙනම වූ මැතිවරණවලින් තීරණය කෙරෙයි.
ආණ්ඩුකරණයට අදාළ ප්‍රධාන කුළුණු තුන අතර සංවරණ හා තුලන ඇති කරමින් බලතල බෙදීම පිළිබඳ මූලධර්මය ක්‍රියාවට යොදවයි.
ව්‍යවස්ථාදායකය මූලිකවම නිති පැනවීමේ සංස්ථාවක් වන අතර තනි තනි නිති සම්පාදකයාගේ වැදගත්කම ඉතා ඉහළ මට්ටමක පවතියි.
විධායකය දේශපාලන කාරණා මත ඉවත් කළ නොහැකි අතර, කළ හැක්කේ දේශපාලනමය නොවන හේතු නිසාය.

**නිගමනය (ලකුණු 2).**
අපේක්ෂකයෙකු ආණ්ඩුක්‍රම දෙක අතර පවතින වෙනස්කම් හා ඊට තුඩු දෙන හේතු දක්වමින් පිළිතුර අවසන් කරන්නේ නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කළ යුතුය.

---

**3. (i) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය අර්ථකථනය කරන්න.**

ප්‍රශ්නය ඉලක්ක කර ඇත්තේ අපේක්ෂකයා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමය.
වචනාර්ථයෙන් ගත හොත් ඉන් අදහස් වන්නේ ආණ්ඩුවක් හෝ යම් සංවිධානයක් වැනි දෑ පාලනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග හා ක්‍රියා කරන ආකාරයයි.
දේශපාලන සංකල්පයක් වශයෙන් ඉන් අදහස් කරන්නේ ආණ්ඩුවේ කාර්ය ඵලය හා ආණ්ඩුව විසින් පොදු සේවා බෙදා හැරීමය.
එය පුළුල් හා වැදගත් සංකල්පයක් බවට පත්ව ඇති අතර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය ආවරණය කිරීමක් දක්වා දිගු වී ඇත. ඒ පොදු ජනතාවට, සිවිල් සමාජයට හා සෙසු අයට ආණ්ඩුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට වැඩි වැඩියෙන් සහභාගි වීමට ඉඩ ලබා දීම තුළිනි.
ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ සංකල්පය පහළ සිට ඉහළට ගමන් කරන (ආරෝහන) තින්දු ගැනීම හා, අවශ්‍යතා අනුව සිදු කෙරෙන සංවර්ධනය, අවධාරණය කරයි.



Scanned with CamScanner

එය ආණ්ඩුව සමාජයට වග කියන හා වග වන දෙයක් බවට පරිවර්තනය කිරීමේ දේශපාලන මූලෝපායයක් වශයෙන් ද සැලකේ.
(ලකුණු 5යි. අපේක්ෂකයින්ට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය යනු කුමක් දැයි අර්ථ දක්වා ඒ විසින් පෙනී සිටින්නේ කුමකට දැයි කිව හැකි නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කළ යුතුය).

**3. (ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 15)**

**හැදින්වීම**

මේ ප්‍රශ්නයේ ඇති "විස්තර කරන්න" යන්නෙන් අදහස් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණ ගැන ඇති අවබෝධය පරිශාකර බැලීම හා ඒවා විස්තර කිරීමය.
අපේක්ෂකයා ආණ්ඩුකරණය හා ප්‍රජාතන්ත්‍රවාදය අතර ඇති සම්බන්ධතාව ගැන කෙටි හැදින්වීමකින් ස්වකීය පිළිතුර ආරම්භ කළ හැකිය.
( ලකුණු 3ක් යෝජිතය. පිළිතුරු පත්‍ර පරීක්ෂකවරුන් හැදින්වීමක් දැඩිව අපේක්ෂා නොකිරීම ගැටළුවක් නොවනු ඇත. ආණ්ඩුකරණය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ කරන අදහසක් ඇති දැයි සොයා බැලීමට වඩාත් අවධානය යොමු කරන්න).

**අන්තර්ගතය**

නීතිය හා සාමය පවත්වා ගන්නා අතර සකලවිධ පුරවැසියන්ගේ පොදු යහපතට සේවය කිරීම සඳහා සමාජය පරිපාලනය කිරීම හෙවත් කළමනාකරණය ආණ්ඩුකරණයෙන් අදහස් කෙරේ.
ආණ්ඩු කිරීමේ මේ ක්‍රියාවලියට පහත දැක්වෙන කාර්යයන් අඩංගු කළ හැකිවේ.

- නීති සෑදීම: සමාජීය යහපත, ගැටුම් කළමනාකරණය, නීතිය හා සාමය පවත්වා ගැනීම, සමාජයේ දේශපාලන හා ආර්ථික දිශානතියට අවශ්‍ය නීති සම්පාදනය.
- ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම : මේ කෘත්‍යය හරහා සමාජයේ ආර්ථික හා සමාජ ප්‍රගතිය, එහි සාමාජිකයින්ගේ සුභසාධනය හා සමාජ හා ආර්ථික වෙනස්කම් සිදු කරනු ලැබේ.
- ප්‍රතිපත්ති සම්පාදනයට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සංස්ථාමය ව්‍යුහය වන රාජ්‍ය පරිපාලනය කළමනාකරණය.
- පුරවැසියන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතතාව සැපයිය හැකි හා සමාජ සාමූහිකත්වය හා සුසංගතතාව ඇතිකරනු පිණිස නීතිය හා සාමය පවත්වා ගෙන යාම
- සමාජ කණ්ඩායම් අතර මෙන්ම කණ්ඩායම් තුළත් කණ්ඩායම්, හා රාජ්‍ය අතරත් ගැටුම් කළමනාකරණය කරගනිමින් අන්තර් රාජ්‍ය සම්බන්ධතා සැකසීම හා කළමනාකරණය

මේවා දේශපාලනයේ ඉතා ප්‍රයෝගික පැතිකඩ වෙයි. ඒබැවින් දේශපාලන විද්‍යාව හදාරන්නන් ඒවාට විශේෂ අවධානයක් යොදයි. ආණ්ඩුවේ ප්‍රායෝගික පැතිකඩ ඉහත ආකාරයට ක්‍රියාත්මක වන සන්දර්භයක් තුළ, ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයෙහි බලපෑම හමුවේ ආණ්ඩුකරණය තුළට පහත සඳහන් ක්ෂේත්‍ර ඇතුලත් වී තිබේ.

1. ව්‍යවස්ථානුකූලවාදය
2. මහජන ස්වාධිපත්‍යය හෙවත් ජනතා පරමාධිපත්‍යය
3. බලතල වෙන් කිරීම
4. සංවරණ හා තුලන
5. නීතියේ අධිපත්‍යය
6. මානව අයිතිවාසිකම්
7. සීමිත ආණ්ඩුව
8. භාරකාරත්වය හා කොන්දේසි
9. සීමිත ධුරකාලය
10. නිදහස් හා සාධාරණ මැතිවරණ
11. ජනතාවට වගවීම

(ලකුණු 12. මෙහි දී උත්තර පරීක්ෂකවරු මේ කරුණුවලට පමණක් සීමා නොවිය යුතු බව සටහන් කරනු ලැබේ).



Scanned with CamScanner

## II කොටස

**4. (i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කරන ලද මූලික අයිතිවාසිකම් විස්තර කරන්න. (ලකුණු 10).**

**අරමුණ**

මෙම ප්‍රශ්නයෙන් ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීමට උත්සාහ කරයි. මේ අනුව, ඔහු/ඇය මූලික අයිතිවාසිකම්, ඒවායේ වැදගත්කම මෙන්ම සීමාවන් හෝ අඩුපාඩු විස්තර කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ සීමාවන් සහ අවාසි විවේචනාත්මකව සාකච්ඡා කරන අපේක්ෂකයින්ට එහි අඩංගු මූලික අයිතිවාසිකම් විස්තර කරන අයට වඩා වැඩි ලකුණු ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ හැකිය.
හැඳින්වීමේදී, අපේක්ෂකයින් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සසඳන විට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව සඳහන් කළ හැකිය (ලකුණු 2).

**අන්තර්ගතය**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි පරිච්ඡේදයේ 10-16 වගන්තිවල මූලික අයිතිවාසිකම් ඇතුළත් වේ අපේක්ෂකයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

- සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමේ නිදහසට ඇති අයිතිය (10 වැනි වගන්තිය)
- වධ හිංසාවලින් හෝ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හෝ දඬුවම්වලින් නිදහස් වීම (11 වැනි වගන්තිය).
- නීතිය ඉදිරියේ සමානාත්මතාව සහ සමාන ආරක්ෂාව සඳහා ඇති අයිතිය (12 වගන්තිය). එය සමානාත්මතාවට සහ වෙනස් කොට නොසැලකීමට ඇති අයිතිය පිළිගනී. මෙම වගන්තියේ සඳහන් වන්නේ: ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි හේතුවක් මත කිසිදු පුරවැසියෙකු වෙනස් කොට සැලකීම නොකළ යුතු බවය.
- අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීමෙන් නිදහස සහ නිසි නෛතික ක්‍රියාවලියකට ඇති අයිතිය (13 වගන්තිය).
- භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස, රැස්වීම, සමාගම් පැවැත්වීම, ආගමික නිදහස, භාෂාව, රටට නැවත පැමිණීමට ඇති අයිතිය සහ සිය රටේ ඕනෑම ප්‍රදේශයක ජීවත් වීමේ අයිතිය. (14 වැනි වගන්තිය).
- 10,11, 12(1), 12 (3) සහ 13 වැනි වගන්තිවල අඩංගු අයිතිවාසිකම් සියලුම පුද්ගලයන්ට අදාළ වන අතර 12 (2) සහ 14 වැනි වගන්ති අදාළ වන්නේ පුරවැසියන්ට පමණි. 2001 වන තෙක් පුරවැසි අයිතිවාසිකම් නොතිබූ ජන කොටසකට වෙනස් කොට සැලකූ මෙම වගන්තිය ව්‍යවස්ථා පරිච්ඡේදයේ කැපී පෙනෙන සීමාවකි (ඉන්දියානු සම්භවය සහිත දෙමළ ජනයා සම්බන්ධව).
- තවද, 10 සහ 11 වගන්තිවල අඩංගු අයිතිවාසිකම් පරම අයිතිවාසිකම් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම අයිතිවාසිකම් සීමා කිරීම හෝ කිසිදු සීමාවකට යටත් කිරීම කළ නොහැක.
- 1972 මූලික අයිතිවාසිකම් සමඟ සසඳන විට, ධනාත්මක ලක්ෂණය වන්නේ නීතිමය පිළියම් සඳහා වූ විධිවිධානය.
- රජය විසින් මූලික අයිතිවාසිකම් සහ නිදහස සීමා කළ හැකි හේතු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තියේ දක්වා ඇත. ප්‍රකාශනයේ නිදහස ක්‍රියාත්මක කිරීම, වාර්ගික හා ආගමික සහජීවනය සඳහා, හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාස කිරීම හෝ උසිගැන්වීම සම්බන්ධයෙන් නීතියෙන් නියම කළ හැකි සීමාවන්ට යටත් විය යුතු බව වගන්තියේ සඳහන් වේ.

* 17 - [illegible]
* [illegible]

- තව දුරටත්, 14 වැනි වගන්තියේ ඇති මූලික නිදහස සීමා කිරීමට රජයට බලය පවරන කාරණා 15 වැනි වගන්තිය ඉදිරිපත් කරයි: (ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම, 1947 මහජන ආරක්ෂක ආඥාපනත (පීඩ) යටතේ ප්‍රකාශයට පත් කර ඇති හදිසි රෙගුලාසි).
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි ව්‍යවස්ථාව මගින් සපයනු ලබන්නේ: පවතින සියලුම ලිඛිත නීති සහ ලිඛිත නොවන නීති, මූලික අයිතිවාසිකම් සමඟ යම් අනුකූලතාවක් සහිත වියයුතු බවය.

පහත සඳහන් කාරණා 1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සම්බන්ධව අඩුපාඩු ලෙස දැක්විය හැක:

- ජීවත්වීමට ඇති සහජ අයිතිය පිළිබඳ පැහැදිලි සඳහනක් නොමැත.
- එමෙන්ම, දේපල අයිතිවාසිකම්, සමාජ අයිතිවාසිකම් (අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස),
- ළමා, කාන්තා, ආබාධිත, සුළුතර අයිතිවාසිකම් වැනි කණ්ඩායම් අයිතීන් නොමැති වීම.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇති අතර එමගින් යහපාලනය සහතික කෙරෙන බව පිළිගන්නා බව ඇතැම් සිසුන් දැකිය හැකිය.
(ලකුණු 7).

ත්‍රස්ත විරෝධී පනත සහ මාර්ගගත ආරක්ෂණ පනත වැනි රජයේ මර්දනකාරී නීති හේතුවෙන් මූලික අයිතිවාසිකම්වලට ඇති වත්මන් අභියෝග/තර්ජන පිළිබඳව අපේක්ෂකයින්ට සාකච්ඡා කළ හැකිය.
(ලකුණු 1).

---

**5. "ශ්‍රී ලංකාවේදී යටත් විජිත රාජ්‍යය ඇතැම් අනපේක්ෂිත සාධනීය ප්‍රතිපල ඇති කර තිබේ." ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.**

මෙම ප්‍රශ්නය මගින් ශ්‍රී ලංකාවේ දී යටත් විජිත රාජ්‍යය, විශේෂයෙන් 1833 - 1947 අතර කාලය තුළ නිර්මාණය කළ අනපේක්ෂිත සාධනීය ප්‍රතිපල තාර්කිකව හඳුනා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට සිසුන් සතු හැකියාව තක්සේරු කිරීමක් අපේක්ෂා කෙරේ.

**හැඳින්වීම (ලකුණු 03)**

යටත් විජිත රාජ්‍යය දිවයිනට සේන්දු වන බ්‍රිතාන්‍ය ආයෝජකයින්ට වඩාත් සුවපහසු පරිසරයක් නිර්මාණය කරන අතර තුර, ආසියාවේ බ්‍රිතාන්‍යය අත් කරගනු ලැබූ ප්‍රදේශ සඳහා ආරක්ෂාව සැපයීම වැනි අධිරාජ්‍යවාදී අභිලාෂයන් ආරක්ෂා කිරීම අරමුණු කර ගත්තේය. කෙසේ වෙතත්, එම ප්‍රතිසංස්කරණවල ප්‍රතිපල සපුරා ඔවුන් අපේක්ෂා කළ ඒවා නොවිණි. ඔවුන් සිදු කළ ප්‍රතිසංස්කරණ හේතුවෙන් සාධනීය සහ නිශේධනීය ප්‍රතිපල ගණනාවක් ඇති වුයේය. මෙම පිළිතුර මගින් එබඳු අනපේක්ෂිත සාධනීය ප්‍රතිපල විග්‍රහ කිරීමක් අපේක්ෂා කරයි.

**අන්තර්ගතය (ලකුණු 15)**

මුදලිවරුන්ගෙන් සැදුම්ලත් සාම්ප්‍රදායික ප්‍රභූ තන්ත්‍රය වෙනුවට දේශීය ධනේශ්වර පන්තියක් බිහිවීම කෙරෙහි මඟ පෑදීම බ්‍රිතාන්‍යයින් සෘජුව අපේක්ෂා නොකළ මුත්, විජිත පරිපාලන ක්‍රමය විසින් ඇතිකරන ලද සාධනීය ප්‍රතිපලයකි. ඔවුහු පළමුව, අරක්කු රේන්ද, සුළු ව්‍යාපාර සහ පරිවහන හා කම්කරු සේවා සැපයීම්වලින් ධනය රැස් කර ගත්හ. මේ නව ධනේශ්වර පන්තිය සමාජ සේවා, අධ්‍යාපන සහ සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවල සංවර්ධනය වෙනුවෙන්ද සිය ධනය විය පැහැදම් කළෝය.

රාජකාරි ක්‍රමය අහෝසි කිරීම සෘජුව සහ වක්‍රාකාරව සමාජ පරිවර්තන ගණනාවකට මං සැලසූ බව පැහැදිලි වේ. ඒ අතර, ශ්‍රම යේ නිදහස් සචලතාවක් ඇතිවීම, පුද්ගලවාදය (individualism) සහ පුද්ගල අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන නෛතික පරිසරය සැකසීම මෙන්ම ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කරනු පිණිස හිතකර වාතාවරණයක් නිර්මාණය වීම වෙසෙසින් වැදගත් වේ. ඒවා සමස්තයක් ලෙස සමාජ සහ සංස්කෘතික පර්යායයෙහි ප්‍රතිසංස්කරණ සහ පරිවර්තන සඳහා හේතු පාදක විය.



Scanned with CamScanner

ලංකා සමාජය තුළ සමානත්මතාවාදී (egalitarian), ප්‍රජාතාන්ත්‍රික අභිලාශ සංවර්ධනය වීම සඳහා ඉහත කී සමාජ පරිවර්තනය හේතු පාදක වුයේය. ඒ කෙරෙහි 1833 දී චාර්ල්ස් කැමරන් විසින් සිදුකළ, සිවිල් අයිතිවාසිකම් සඳහා ද පාදක වූ, අධිකරණමය නිදහස සම්බන්ධ වාතාවරණය පැහැදිලි බලපෑමක් කළේය. සිවිල් අයිතිවාසිකම් වර්ධනය විසින් උත්පාදනය කළ විවෘත සමාජය ධනේශ්වර ආර්ථික කටයුතු සහ සමාජ සාමූහිකත්වයන් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කළේය.

මේ වර්ධනය වෙමින් පැවති නව ධනේශ්වර පන්තියේ දෙවන සහ තෙවන පරම්පරා ඉංග්‍රීසි උගත්, බටහිරකරණය වූ මධ්‍යම පන්තියක් වූ අතර ඔවුහු පසුකාලීන ආගමික පුනර්ජීවනය, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, ජාතික ව්‍යාපාරය සහ වාමාංශික ව්‍යාපාරය යනාදී සමාජ ව්‍යාපාරවල පෙරමුණ ගත්හ.

කුමාරි ජයවර්ධන නිරීක්ෂණය කළ පරිදි මධ්‍යම පාන්තික ප්‍රභූන්ගෙන් බොහොමයක් අධිපති සිංහල කුලවලින් පිටස්තරව පැමිණි අතර එය නියත උඩුකුරු සමාජ සචලතාවකටත් (upward social mobility), සාම්ප්‍රදායික සමාජ ව්‍යුහයේ පරිවර්තනයකටත් හේතු විය. ඉංග්‍රීසි අධ්‍යාපනයේ ව්‍යාප්තිය සහ සමාජ, සංස්කෘතික අවකාශයේ පරිවර්තන විසින් ඉඩම් අයිතිය මත පදනම්ව පැවති වැඩවසම් සමාජ පර්යාය වෙනුවට නව, නූතන සමාජ පර්යායක ආරම්භයක් ආදේශ කරනු ලැබීය.

යටත් විජිත ප්‍රතිසංස්කරණවල තවත් අනපේක්ෂිත ප්‍රතිපලයක් වූයේ ලංකා සිවිල් සමාජයක නැගීමයි. මේ යටත් විජිත සිවිල් සමාජය ආගමික හා කුල සංගම්, වෘත්තිය සංගම්, කාන්තා සංවිධාන, පුනර්ජීවන ව්‍යාපාර, ජාතික බලමුළු ගැන්වීම්, නන්විද ස්වේච්ඡා සංවිධාන සහ කාලානුරූපව දේශපාලන කණ්ඩායම්වලින් සමන්විත විය. එම සිවිල් සමාජ බලමුළු ගැන්වීම්, විජිත විරෝධී ව්‍යාපාර සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උදෙසා වූ අරගලවල පෙරමුණ ගත්හ.

යටත් විජිත සමාජ හා සංස්කෘතික වෙනස සමකාලීන ප්‍රතිසංස්කරණවලින් ප්‍රතිලාභ ලැබූ අය සහ නොලැබුණු අය අතර නව ආකාරයක සමාජ ධ්‍රැවීකරණයක් ද නිර්මාණය කළේය. යටත් විජිත ආර්ථිකයට සම්බන්ධ වී හෝ නිලධර තන්ත්‍රයේ කොටසක් වී හෝ ධනය උපයා ගත්තවුන් යටත් විජිත සංස්කෘතිය, සාරධර්ම සහ ජීවන රටා ද වැළඳ ගත්හ. ඔවුහු යටත් විජිත රාජ්‍යයට පක්ෂපාති, වරප්‍රසාද ලත්, දේශීය ප්‍රභූ පැලැන්තියක් පිහිටුවා ගත්හ.

ඉන් ප්‍රයෝජනයක් නොලබන ලද්දේ යටත්විජිතවාදය විසින් විවෘත කරන ලද ඉංග්‍රීසි අධ්‍යාපනයෙන් හා ආර්ථික අවස්ථාවලින් බැහැරව සිටි සමාජ පන්ති ය. ඔවුහු ප්‍රාදේශීය, ආගමික, සහ වාර්ගික අනන්‍යතා මත පදනම් වූ සාම්ප්‍රදායික පරමාදර්ශ සහ සාරධර්මවලට අනන්‍යව, තමන්ගේම වූ "සිවිල් සමාජයක්" පිහිටුවා ගත්හ. ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය විවෘත වීම සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය පුළුල් කිරීමට ඍජුවම දායක විය.

සර්වජන වැඩිහිටි ඡන්ද බලය හඳුන්වාදීම රටේ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයට දායක විය. අවසානයේ එය දේශපාලන ස්වාධීනත්වයේ අභිලාෂයන් වැළඳ ගැනීමට උත්ප්‍රේරකයක් බවට පත් වූයේය.
ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ දේශපාලන පක්ෂ ක්‍රමයක් වර්ධනය වී නොතිබිණි. යටත් විජිත පරිපාලකයින් පක්ෂ ක්‍රමයක් සංවර්ධනය කිරීම දිරි ගැන්වූයේ නැතත්, සර්වජන ඡන්ද බලය පක්ෂ ක්‍රමයක් ගොඩනැගීමට මග පෑදීය.

නියෝජිත ආන්ඩුකරණය සහ සර්වජන ඡන්ද බලයේ මූලධර්මය ජනතාවගේ දේශපාලන බල ගැන්වීම ඉහල නැංවීය. එය ආන්තික සමාජ සහ වාර්ගික කණ්ඩායම්වලට ඔවුන්ගේ විමුක්තිය පිළිබඳ සවිඥානික වීමට සැලකිය යුතු ලෙස උපකාර විය.

නූතන සුබසාධන රාජ්‍යයේ මතුවීම ද 1931 දී හඳුන්වා දුන් යටත් විජිත ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් වූ දේශපාලනඥයන් මහජන සහයෝගය ලබා ගැනීම සඳහා සමාජ සුබසාධන වැඩසටහන් ආරම්භ කිරීමට උත්සුක විය. එහි ප්‍රතිඵලය වූයේ 1931-1947 කාලය තුළ සමාජ අයිතීන් පිළිබඳ ප්‍රබල සවිඥානිකත්වයක් නිර්මාණය වීමයි.

**සාරාංශය (ලකුණු 02)**



Scanned with CamScanner

යටත් විජිත අවශ්‍යතා සහ අභිලාශ පූරණය කරනු පිණිස සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ, යටත් විජිත රාජ්‍යවල දේශපාලන, ආර්ථික සහ සමාජ-සංස්කෘතික සංවර්ධනයන් පුළුල් කළ හැකි අනපේක්ෂිත සාධනීය ප්‍රතිඵල ඇති කිරීම වැළැක්විය නොහැකිය. 1948 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාව ලබා ගත් දේශපාලන නිදහසේ කුළුගැන්වීම සිදු වූයේ යටත් විජිත රාජ්‍යය විසින් 1833 සිට 1947 දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණවල අපේක්ෂිත හා අනපේක්ෂිත ප්‍රතිඵලවල ක්‍රමානුකූල වර්ධනය පාදක කර ගනිමිනි.

**6. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳ රචනයක් ලියන්න (ලකුණු 20)**

මෙම රචනය ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම, ඇගයීම් කුසලතා සහ ආකල්ප පරීක්ෂා කිරීමට ඉඩ සලසයි.

**හැඳින්වීම.**

අපේක්ෂකයාට දේශපාලන පක්ෂ සහ දේශපාලන පක්ෂ ක්‍රම පිළිබඳ හැඳින්වීමකින් පිළිතුර ආරම්භ කළ හැකිය.

දේශපාලන පක්ෂ යනු රටක් පාලනය කිරීම පෙරදැරිව, බලය අල්ලා ගැනීමට සහ දේශපාලන බලය ක්‍රියාත්මක කිරීමට සංවිධානය වූ පුද්ගල කණ්ඩායමකි. දේශපාලන පක්ෂවල විශේෂ ලක්ෂණය වන්නේ පක්ෂයේ සාමාජිකයන් විසින් අදහස් හා අවශ්‍යතා බෙදා හදා ගැනීම සහ ආණ්ඩු බලය අල්ලා ගැනීම අරමුණු කර ගැනීමයි. පක්ෂ සහ නූතන ප්‍රජාතන්ත්‍රවාදය අතර සමීප සම්බන්ධයක් පවතී.

පක්ෂ ක්‍රමයක් (party system) නිර්වචනය කර ඇත්තේ ආධාරක පදනම (support base), එනම් ආණ්ඩු බලය අල්ලා ගැනීමට සහ ආණ්ඩු පිහිටුවීමට හැකි පක්ෂ ගණන පාදක කර ගනිමිනි. ඒ අනුව, තනි පක්ෂ ක්‍රමය, ද්වි-පක්ෂ ක්‍රමය, බහු පක්ෂ ක්‍රමය, ආධිපත්‍ය පක්ෂ ක්‍රම සහ සභාග පක්ෂ ක්‍රමය වැනි විවිධ පක්ෂ ක්‍රම ප්‍රභේද නිර්මාණය වී තිබේ.
(ලකුණු 03)

**අන්තර්ගතය (ලකුණු 15).**

ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය සම්බන්ධයෙන් අධ්‍යයනිකයින් විසින් විවිධාකාරයෙන් විස්තර කරනු ලැබ ඇත. එනම්;

1. ද්විපක්ෂ ක්‍රමයක් ලෙසː ආණ්ඩු බලය අල්ලා ගැනීමට බොහෝ විට පක්ෂ දෙකක් තරඟ කරයි
2. බහු පක්ෂ ක්‍රමයː ආණ්ඩු බලය අල්ලා ගැනීමට තරඟ කරන දේශපාලන පක්ෂ සැලකිය යුතු ප්‍රමාණයක් පවතී.
3. ද්වි-පක්ෂ සභාග ක්‍රමය. ප්‍රධාන පක්ෂ දෙකක් තිබෙන අතර අනෙකුත් සුළු පක්ෂ දේශපාලන බලය අල්ලාගෙන ආණ්ඩුවට සම්බන්ධ වීමට සඳහා සභාග ගොඩනගන ක්‍රමයක් වේ.

සමහර කතුවරුන් 1947 සිට 1956 දක්වා කාලය එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ වශයෙන් බලය අත්කරගත් බැවින්, එක්සත් ජාතික පක්ෂයේ ඒක පක්ෂ ආධිපත්‍යයක් ලෙස සංලක්ෂිත කර ඇත. මේ ආධිපත්‍යය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉස්මතුවීමත් සමඟ වෙනස් වී තිබේ.

ශ්‍රී ලංකාවේ කේඩර පක්ෂ කිහිපයක් තිබුණද වර්තමානයේ ඇතැම් ඒවා වේගයෙන් වියැකී යන ආකාරයක් දක්නට තිබේ.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ද්වි-පක්ෂ ආධිපත්‍ය සභාග ක්‍රමයක් ලෙස හැඳින්වීම තාර්කික බව බොහෝ කතුවරුන් පෙන්වා දී ඇත.

පක්ෂ ක්‍රමයේ ඉතිහාසය හොඳින් විමසා බැලුවහොත් 1956 මහ මැතිවරණයේ සිට ආණ්ඩු පිහිටුවීම සඳහා සභාග පිහිටුවා ගත් ප්‍රධාන පක්ෂ දෙකක් තිබූ බව හෙළි වනු ඇත.

ආරම්භයේදී එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එහි ප්‍රමුඛත්වය ගත්තේය. කෙසේ වෙතත්, විවිධ පෞද්ගලික මතාන්තර වටා දේශපාලන පක්ෂ ඛණ්ඩනය වී ඇති අතර ඒවා ආණ්ඩු පිහිටුවීම සඳහා සභාග පිහිටුවීමේ පදනම බවට පත්විය. මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවට පොදුජන පෙරමුණ ද, එක්සත් ජාතික පක්ෂය වෙනුවට සමගි ජනබල වේගය ද ආණ්ඩු බලය හසුරුවන හත්වයක් දක්නා ලැබේ.



Scanned with CamScanner

පක්ෂ ක්‍රමයේ අනෙකුත් ප්‍රවණතා අතර වාර්ගික සුළු පක්ෂ, පක්ෂ බණ්ඩනය වීම, කේඩර පක්ෂ ක්‍රමයෙන් බහුජන පක්ෂ බවට පත්වීම යනාදිය දැක්විය හැකිය.

ශ්‍රී ලංකා පක්ෂ ක්‍රමයේ තවත් ප්‍රවණතාවක් වන්නේ දේශපාලන පක්ෂවල වාමාංශික - දක්ෂිනාංශික මතවාදී පදනම ක්‍රමක්‍රමයෙන් පිරිහීම සහ ඒ වෙනුවට ලිබරල් ආර්ථික පර්යාය වඩාත් සාධනීයව පවත්වා ගෙන යා හැකි කළමනාකරු වන්නේ කුමන පක්ෂයද යන්න ප්‍රබලව අවධාරණය කෙරේ.

රටේ දේශපාලන ජනවිකාසය බහුතර සිංහලයන් මෙන්ම දෙමළ සහ මුස්ලිම් වැනි සුළුතර කණ්ඩායම් අතර නිශ්චිත ජනවාර්ගික විබෙදුම් සඳහා දිරිගැන්වීම් සලසා ඇත.

**නිගමනය (ලකුණු 2)**

අපේක්ෂකයා පක්ෂ ක්‍රමය මැතිවරණ ක්‍රමය හා සම්බන්ධ කරන්නේ නම් සහ මතවාදී ගැටුම් පිරිහෙන ආකාරය ද විශ්ලේෂණය කර ඇත්නම්, සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබා දිය හැකිය.

---

**7. (i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔම්බුඩ්ස්මන්වරයා (පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා) සතු බලතල සහ කාර්යයන් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)**

මෙම ප්‍රශ්නයේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල සහ ප්‍රධාන කාර්යයන් කෙටියෙන් ප්‍රකාශ කිරීමට අපේක්ෂකයාගේ හැකියාව තක්සේරු කිරීමයි.

ඔම්බුඩ්ස්මන් ආයතනය හඳුන්වාදීමේ අරමුණ වූයේ පුරවැසියාගේ මානව හිමිකම් ආරක්ෂා කරන්නෙකු සහ ආරක්ෂකයෙකු නිර්මාණය කිරීමයි. "රාජ්‍ය පරිපාලනය තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීමේදී ඔම්බුඩ්ස්මන්වරයා ඉටු කරන කාර්යභාරය ද' පුරෝකථනය කළ අපේක්ෂාවකි.

පරිපාලන ක්‍රියාකාරකම්වල අධීක්ෂකවරයා ලෙස ඔම්බුඩ්ස්මන් ආයතනයේ මූලික කර්තව්‍යයන් බොහෝ විට මානව හිමිකම් උපනතියකින් සමන්විත වේ. ඒ පරිපාලනයේ දුර්වලතා විසින් අතවශ්‍ය මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබිය හැකි බැවිනි.

රජු, ඔහුගේ කාර්යාලය සහ අධිකරණය අධීක්ෂණය කිරීම සඳහා ඔම්බුඩ්ස්මන් තනතුර මුලින්ම හඳුන්වා දුන් රට ස්වීඩනයයි. ඒ 1809 දීය. පසුව, මෙම තනතුර රටක රාජ්‍ය පරිපාලනය පාලනය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස හඳුනාගෙන ලොව පුරා රාජ්‍යයන් හඳුන්වා දී ඇති අතර ඒ සම්බන්ධ ප්‍රතිපාදන ජාතික නීති පද්ධතිවලට ඇතුළත් කර ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වැනි ව්‍යවස්ථාව මගින් ඔම්බුඩ්ස්මන් තනතුර ශ්‍රී ලංකාව තුළ මූලික අයිතිවාසිකම් සුරැකීමේ යාන්ත්‍රණයක් ලෙස හඳුන්වා දෙන ලදී. 1981 අංක 17 දරන පරිපාලනය සඳහා වූ පාර්ලිමේන්තු කොමසාරිස් පනත මගින් ඔම්බුඩ්ස්මන් තනතුර පිහිටුවා එහි බලතල, යුතුකම් සහ කාර්යයන් නිර්වචනය කළේය. ඉන් අනතුරුව, 1994 අංක 26 දරන පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත විසින් මුල් පනතේ 10 වැනි වගන්තිය සංශෝධනය කරන ලදී.

ඔම්බුඩ්ස්මන්වරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, යහපත් කල්ක්‍රියාවක් සහිතව, නියමිත කාලය තුළ ඔහු ධූරය දැරිය යුතුය.

**ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල සහ කාර්යයන්:**

ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල සහ කාර්යයන් පහත සාරාංශගත කළ හැකිය.

**බලතල**

1994 අංක 26 දරන පනත මගින් හා සංශෝධිත 1981 අංක 17 දරන පනත මගින් පැවරී ඇති බලතල අනුව, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ගේ ප්‍රධාන කාර්යය වන්නේ, රාජ්‍ය



Scanned with CamScanner

නිලධාරියකු, පළාත් සභාවල නිලධාරියකු හෝ රාජ්‍ය සංස්ථා නිලධාරියකුගේ හෝ වෙනත් ඒ හා සමාන ආයතනයක ක්‍රියාවක් මඟින් මූලික අයිතිවාසිකම් හෝ ආසන්නයේ සිදුවෙමින් පවතින හෝ සිදුවීමට ඉඩ ඇති වෙනත් සමාන අසාධාරණයන්, අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි ලැබීමෙන් පසු පරීක්ෂණ පවත්වා සාධාරණ නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

**කාර්යයන්:**

සාමාන්‍ය මහජනතාව විසින් ඔම්බුඩ්ස්මන්වරයා වෙත සෘජුවම යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම; රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් සභා හෝ වෙනත් ආයතනවල නිලධාරීන් විසින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ ඒ හා සමාන අසාධාරණයන් මුලිනුපුටා දැමීමේ අදහසින්, වැරදි පරිපාලන තීරණ ආපසු හැරවීමට ඉල්ලීම්, යෝජනා කිරීම සහ/හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඔම්බුඩ්ස්මන්වරයා විසින් පෙර ඡේදයේ සඳහන් පරිදි අයිතිවාසිකම් කඩවීමක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට අනාවරණය කළ විට, අදාළ කරුණු විමර්ශනය කර, පසුව සිදු වූ අසාධාරණයන් සමනය කරනු පිණිස තීරණවලට එළැඹේ.
එබැවින් මෙම ආයතනයේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයන්ට සහන සලසන අතරම රටේ නීති සහ ඒ යටතේ ඇති කරන ලද නීති රීතිවලට අනුකූලව ශ්‍රී ලංකාවේ පරිපාලන යාන්ත්‍රණය නිවැරදි මාවතකට යොමු කිරීමයි.

---

**7. (ii) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර ඇති සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 15).**

මෙම ප්‍රශ්නයේ පරමාර්ථය වන්නේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුවේ ප්‍රධාන ආයතන දෙක වන ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධතාවය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම තක්සේරු කිරීමයි.
මෙහිදී වත්මන් ව්‍යවස්ථාවට කරන ලද ප්‍රධාන ව්‍යවස්ථාමය සංශෝධන ද මත පදනම්ව ආයතන දෙක අතර සම්බන්ධතාවයේ වෙනස්වන ස්වභාවය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය තක්සේරු කිරීමට උත්සාහ කරයි.
මෙම ප්‍රශ්නයට පිළිතුර පහත පරිදි සංවිධානය කර ගත හැකිවේ.

- ආයතනවලට අදාළ තෝරා ගැනීමේ ක්‍රියාවලිය, නිල කාලය, ආයතන දෙකෙහිම බලතල සහ කාර්යයන් සහ සම්බන්ධතාවයේ ප්‍රධාන ක්ෂේත්‍රය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන සංශෝධනවලින් පසු ආයතන දෙක අතර සබඳතාවල වෙනස්වන ගතිකත්වය.

**අන්තර්ගතය**

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව විවිධ පාර්ශවයන්ගෙන් විවේචනවලට ලක්වූ විශේෂාංග සහිත වූ අතර ශුද්ධ පාර්ලිමේන්තු ක්‍රමයක් නොවිය. විධායක සහ ව්‍යවස්ථාදායක බලතල එක්ව නිර්මාණය කළ ජාතික රාජ්‍ය සභාවේ කාර්යභාරය පිළිබඳව ප්‍රධාන වශයෙන් විවේචන එල්ල විය.

ඊට විකල්පව, දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) යටතේ හඳුන්වා දුන් විධායක ජනාධිපති සහ කැබිනට් ආණ්ඩු ආකාර දෙකෙහිම අංගවල සම්මිශ්‍රණයකි. එහි ප්‍රතිඵලයක් ලෙස ද්විත්ව විධායකයක ස්වරූපයක් අත්පත් කරගත් ආණ්ඩු ක්‍රමයක් නිර්මාණය වී ඇත.

ඒ අනුව දේශපාලන විධායකය සමන්විත වන්නේ වෙනම මැතිවරණයකින් ජනතාව විසින් සෘජුවම තෝරා පත් කර ගන්නා ජනාධිපතිවරයෙකුගෙන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බහුතර කැමැත්ත දිනා ගන්නා පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් තෝරා ගත් අගමැතිවරයෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයකිනි.



Scanned with CamScanner

දේශපාලන විධායකයේ ප්‍රධානියා වන්නේ ජනාධිපතිවරයා මිස අගමැතිවරයා නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික විධිවිධානවලට අනුව සමස්ථ දිවයිනම තනි ඡන්ද කොට්ඨාසයක් ලෙස ගෙන ජනාධිපතිවරයා වසර හයක කාලයක් සඳහා තෝරා පත් කර ගනු ලැබේ. එහෙත්,19 වැනි සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 5කට සීමා කෙරිණි. මුලදී, ජනාධිපති ධුර කාලය වාර දෙකකට සීමා වූ අතර, ඒ සෑම එකක්ම වසර හයක කාලයක් දක්වා දීර්ඝ විය. මෙම වාර සීමාව 2010 දී 18 වැනි සංශෝධනය යටතේ ඉවත් කර, 2015 දී 19 වැනි සංශෝධනය යටතේ නැවත ගෙන එන ලදී.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ මහජන ආරක්ෂාවට අදාළව දැනට පවතින නීතිය ඇතුළු ඕනෑම ලිඛිත නීතියක් යටතේ තමාගේ බලතල, යුතුකම් සහ කාර්යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුය.

**පාර්ලිමේන්තුව:**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය 'පාර්ලිමේන්තුව' ලෙස නම් කර ඇත. එය මන්ත්‍රීවරුන් 225 කින් සමන්විත ඒකමණ්ඩල ව්‍යවස්ථාදායකයකි. ආරම්භයේදී, පාර්ලිමේන්තුවේ නිල කාලය වසර හයක් වූ අතර එය පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමය යටතේ පාර්ලිමේන්තු සාමාන්‍ය ධුර කාලයෙන් වසරක වැඩිවීමකි. නමුත් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව වත්මන් පාර්ලිමේන්තුවේ කාලය වසර පහකට සීමා කොට ඇත.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධය පහත සඳහන් සන්දර්භයන් යටතේ විස්තර කළ හැකිය.

- පාර්ලිමේන්තුවට අදාළ ජනාධිපතිගේ චාරිත්‍රානුකූල බලතල
- පාර්ලිමේන්තුව කැඳවීමට, සැසිවාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට අදාළ ජනාධිපති බලතල
- පනතක් සම්මත කර ගැනීමට/ සම්මත කිරීමට සහභාගී වීමට සහ බලපෑම් කිරීමට ජනාධිපතිවරයාගේ හැකියාව/බලය.
- ජනාධිපතිවරයාගේ වගකීම පාර්ලිමේන්තුවට පිළිතුරු දීමයි.
- ප්‍රතිපත්ති සහ වැඩසටහන් සඳහා ජනතාවගේ සෘජු අනුමැතිය ලබාගැනීම සඳහා ජනමත විචාරණයක් කැඳවීමට අදාළව ජනාධිපතිවරයාගේ බලය.
- ජනාධිපතිවරයා ඉවත් කිරීමේදී පාර්ලිමේන්තුවේ කාර්යභාරය.
- ජනාධිපතිවරයාගේ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු පාලනය

කෙසේ වෙතත්, විශේෂයෙන්ම මෑතකදී සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙරෙහි අවධානය යොමු කරමින් ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව එකිනෙකාට බලපෑම් කිරීමේදී (විශේෂයෙන් ඔවුන්ට පවරා ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී) ඇති සීමාවන් කෙටියෙන් විස්තර කිරීමට අපේක්ෂකයාට හැකි විය යුතුය.

ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර සබඳතාවයේ අර්බුද සනිටුහන් කිරීම සඳහා මෑතකාලීන අත්දැකීම් කිහිපයක්ද ඉදිරිපත් කිරීමට අපේක්ෂකයාට හැකියාව තිබිය යුතුය.

## III කොටස

**8. (i) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.**

ප්‍රශ්නයෙන් අරමුණු කරන්නේ ශිෂ්‍යයා / අපේක්ෂකයා සතු ස්විට්සර්ලන්ත මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන අතර සම්බන්ධතාව පැහැදිලි කිරීමට ඇති හැකියාව මැන බැලීමය.

මෙම පිළිතුරේ දී අපේක්ෂකයා ස්විට්සර්ලන්ත ෆෙඩරල් ක්‍රමය විස්තර කරන හැඳින්වීමක් ලිවිය හැකිය. (හැඳින්වීම සඳහා ලකුණු 2 ක් වෙන් කරනු ලැබේ)



Scanned with CamScanner

අන්තර්ගතය (ලකුණු 8)

ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමය ලොව පවත්නා සම්භාව්‍ය සන්ධීය ක්‍රමවලින් එකකි. එය බලය මධ්‍යගත නොවීම පිළිබඳ සිද්ධියක් ලෙස සලකනු ලැබේ.

ස්විට්සර්ලන්තයේ ඉතිහාසය සමාජ හා දේශපාලන ජන විද්‍යාව එය අසහාය සිද්ධියක් බවට පත් කර ඇත. එය ආරම්භ කරනු ලැබුවේ 1848 දී ය. ඒ අවස්ථාවේ දී කැන්ටන ස්වකීය රාජ්‍යත්වය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා දේශපාලන ස්වායත්ත බවින් වැඩි කොටසක් සිය සන්තකයේ ම තබා ගැනීම තෝරා ගත්තේය. ඔවුන් කළ තෝරාගැනීම තුළින් සන්ධීය ආණ්ඩුවට (මධ්‍යම ආණ්ඩුවට) බලතල කිහිපයක් පමණක් පවරාදීමට තීරණය කළ අතර මධ්‍යම ආණ්ඩුවේ අධිකාරී ආයතනවලට තීන්දුගැනීමේ ක්‍රියාවලියට අදාළ වැදගත් අයිතිවාසිකම් තමන් සතුව රඳවා ගත්තේය. තවද, මධ්‍යම ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ බලතල ද තමන් සතුව තබාගත්තේය.

ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයේ මධ්‍යම ආණ්ඩුවත් කැන්ටන අතර බලතල බෙදීම අදටත් සිදුකරනු ලබන්නේ ව්‍යවස්ථාවේ තුන්වන වගන්තිය මගිනි. එහි ඇතුළත් සාමාන්‍ය ඌනපූරකත්වය පිළිබඳ විධිවිධානය මගින් ප්‍රකාශිතවම මධ්‍යම රාජ්‍යයට පවරා දී නොමැති සියළු කටයුතු කැන්ටන සතුව තබාගනියි.
ස්විට්සර්ලන්ත පාර්ලිමේන්තු ක්‍රමය මධ්‍යම ආණ්ඩුවේ කටයුතුවලට සාමාජික හෙවත් කොටස්කාර රාජ්‍යයන්ට නියෝජන යාන්ත්‍රණයක් බිහිකර තිබේ.

ස්විට්සර්ලන්ත සම්ප්‍රදාය ඇමෙරිකානු සම්ප්‍රදාය යම් කාරණා මගින් සමාන්තර වේ. එනම්, ව්‍යවස්ථාදායක මණ්ඩල දෙකකින් සැදි ද්විමාණ්ඩලිකවාදයක් සහිතය. එහිදී ජාතික මණ්ඩලය සමස්ත ජනතාව නියෝජනය කරන අතර කැන්ටන කවුන්සිලය සාමාජික රාජ්‍ය නියෝජනය කරයි. මණ්ඩල දෙකටම සමාන බලතල ඇති අතර සියළු ගැටලු මණ්ඩල දෙකේදී ම සාකච්ඡා කරනු ලැබේ.
මණ්ඩල දෙකේදී ම බහුතරයකින් අනුමත වන්නේ නම් ෆෙඩරල් නීති වලංගු වේ. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාපටිපාටියට අදාළ වන ද්විත්ව බහුතරය යන මූලධර්මය ක්‍රියාත්මක වේ. ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලට අදාළ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය ෆෙඩරල් ආණ්ඩුවේ යෝජනාවක් වශයෙන් හෝ ජනතා ප්‍රාරම්භයක් නිසා සිදුවිය හැකිය. ඒවා අනිවාර්ය ජනතා ඡන්දයකින් අනුමතවීමට යටත් ය.
යම් නීතියක් අනුමත වීමට නම් ජනතාවගෙන් බහුතරයකගෙන් හා කැන්ටන බහුතරයක අනුමැතිය ලැබිය යුතුය. සන්ධීය ආණ්ඩුවේ තීරණ නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය තුළ සුවිශේෂ ස්ථානයක් කැන්ටනවලට ලබා දී ඇත. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිමත් අංගෝපාංගවල මෙන්ම සන්ධීය ආණ්ඩුවේ නීති සම්පාදනය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යන අවධි දෙකේදී ම සිදුවේ. ඒ පූර්ව පාර්ලිමේන්තු ක්‍රියාවලිය තුළදී ය. මධ්‍යම ආණ්ඩුව කැන්ටන 26 ක් හා කොමියුන 3000 ක් ඇතුළත් වූ බහු-තල ආණ්ඩුකරන ක්‍රියාවලියන් තුළ තීන්දු ගැනීම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සිදුවේ.

19 වන ශතවර්ෂයේ ස්විට්සර්ලන්ත ෆෙඩරල්වාදයේ ආරම්භක අදහස වූ සිරස් බලතල බෙදීම යන අදහස වියැකී යෑමට මෙම සමූපකාරවාදී ෆෙඩරල් ජාලය හේතු වී ඇත.
ඓතිහාසික පර්යාවලෝකනයකින් ස්විට්සලන්ත ෆෙඩරල් ක්‍රමය දෙස බැලුවහොත් එය රැඩිකල් ප්‍රොතෙස්තන්ත්‍ර බහුතරය හා ගතානුගතිකවාදී සුළුතරය අතර ඇති වූ දේශපාලන සම්මුතියකි- රැඩිකල් බහුතරයට ශක්තිමත් ජාතික ආණ්ඩුවක් අවශ්‍ය වූ අතර ගතානුගතික සුළුතරය කැන්ටන ස්වාධිපත්‍ය අතහැරීමට අකමැති වූහ. තවද ප්‍රංශ, ඉතාලි හා රෝමැනිෂ් යන භාෂා කතා කරන සුළුතරය ජර්මන් කතා කරන බහුතරයෙන් ආරක්ෂා කිරීමට ෆෙඩරල්වාදය හේතු වී ඇත.

පසුගිය දශකවලදී ආණ්ඩුවේ වගකීම් වැඩි වී ඇති නමුත් මධ්‍යම ආණ්ඩුව පාලනය කරනු ලබන්නේ පෙදු ආදායමෙන් හා වියදමෙන් තුනෙන් එකක් පමණි. ඊට වෙනස්ව යමින් කැන්ටන හා කොමියුන මූල්‍ය හා කාර්ය මණ්ඩල සම්පත්වලින් තුනෙන් දෙකක් හසුරුවනු ලබන අතර ප්‍රතිපත්ති වැඩසටහන් විශාල ප්‍රමාණයක ප්‍රධාන වගකිවයුතු කාර්යධරයා වේ. තවද, ඔවුහු මධ්‍යම ආණ්ඩුවේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමේදී කැපීපෙනෙන කාර්යභාරයක් ඉටු කරයි.



Scanned with CamScanner

කැන්ටනයකින් මධ්‍යම ආණ්ඩුවට යම් බලයක් පවරා දෙන හැම අවස්ථාවකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයෙන් අවශ්‍ය වන අතර ජනමත විචාරයකට ද ලක් කළ යුතුය.
ස්විට්සර්ලන්ත පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ හා සන්ධීය බලපෑම යන දෙකෙහි ම සමාන වැදගත්කමක් නිරූපණය කරයි. මේ අනුව පෙනී යන්නේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම යන දෙයදියරේදී ම කැන්ටන බලවත් බවය.

ස්විට්සර්ලන්ත තීන්දු නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ එනම් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පූර්ව පාර්ලිමේන්තු සහභාගීත්වය හා අදහස් විමසීම යන ක්‍රියාවලියට දැඩි ලෙස බැඳී පවතී.

**8. (ii) ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය යැයි පවසන්නේ ඇයි ?**

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය යැයි කීමට බලපාන හේතු දැක්වීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමය.
ඉන්දියානු සන්ධීය ක්‍රමය අර්ධ සන්ධීය යැයි ප්‍රකාශ කිරීම එක් අතකින් හාස්‍යජනකය. එය ස්වකීය දේශපාලන සංවිධානය විස්තර කිරීම සඳහා සංගමය යන වචනය තෝරා ගෙන ඇත. අනෙක් අතට එය ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ සන්ධීයභාවය පිළිගැනීමකි.

අපේක්ෂකයා තම පිළිතුර හැඳින්වීමකින් ආරම්භ කළ හැකිය. ( හැඳින්වීමට ලකුණු 2 ක් වෙන් කරනු ලැබෙන කෙසේ වෙතත් පිළිතුරු පත්‍ර පරීක්ෂකවරයා ස්වකීය නිගමනය භාවිත කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ)

**අන්තර්ගතය( ලකුණු 8)**

ඉන්දියාව යනු ප්‍රාන්ත රාජ්‍ය සංගමයකි.එයට ප්‍රාන්ත ආණ්ඩු 28 ක්, මධ්‍යම ආණ්ඩුවත් හා 8 ක් පමණ වූ සාංගමික භූමි ප්‍රදේශයත් අයත් වේ. ප්‍රාන්ත රාජ්‍ය හා සාංගමික භූමි ප්‍රදේශ අතර වැදගත් වෙනස්කමක් පවතී.
ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රාන්තවල ස්වායත්තතාව ලබාදේ. එම ස්වායත්තතාව ෆෙඩරල් ස්වායත්තතාවට ම සමානය. එය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර බලතල වෙන්කර දීමේ දී ලැයිස්තු ක්‍රමය අනුගමනය කරයි. ප්‍රාන්ත සතුව ඍජුව ජනතාව විසින් තෝරාගනු ලබන ව්‍යවස්ථාදායක සභාවක් ඇත.

ආණ්ඩුකාරවරයා මධ්‍යම ආණ්ඩුව නියෝජනය කරනු ලබන නමුත් ප්‍රාන්ත ආණ්ඩුවේ විධායක කාර්යන් සම්බන්ධයෙන් ඔහුගේ බලතල සීමිතය. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංගමය යන පදය යෙදීම නොපැහැදිලි ය. ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය යැයි කීමට ඉන්දියාවේ ඉතිහාසය ඈඳී ඇත.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් මුහුණදුන් අභියෝගය වූයේ ඉන්දියානු සංගමය පවත්වා ගැනීම හා විවිධත්වයට පහසුකම් සැපයීමයි. ඔවුන් සතු වරණය වූයේ සාමාන්‍ය කාලවලදී ඉන්දියානු ආණ්ඩුක්‍රමයට සන්ධීය ආණ්ඩුවක් ලෙස ක්‍රියාකිරීමත් සුවිශේෂ අර්බුදකාරී අවස්ථාවල දී ඒකීය රාජ්‍යයක් ලෙස කටයුතු කිරීමට ඉඩසැලසීමය.

**ඉන්දියානු සන්ධීයවාදයේ විශේෂ ලක්ෂණ**

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඍජුවම එය සන්ධීය යැයි නොකියන නිසා එහි සන්ධීය ලක්ෂණ ව්‍යංගිතව පවතී. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, එම ක්‍රමය ෆෙඩරල් නොවේ යැයි පැහැදිලිව ම නොකියන නිසා එහි ෆෙඩරල් ලක්ෂණ දක්නට ලැබෙන්නේ එහි ව්‍යූහය තුළ ය. ඒ අනුව මධ්‍යම ආණ්ඩුවේ හා ප්‍රාන්ත ආණ්ඩුවේ බලතල වෙන් කිරීමට විධිවිධාන සලසයි.
ව්‍යවස්ථාව සතු ඒකීය ලක්ෂණ ද පවතී. ප්‍රාන්ත ආණ්ඩු සම්බන්ධ මධ්‍යම ආණ්ඩුවේ බලය එනම් ප්‍රාන්ත ආණ්ඩු විසුරුවා හැරීමට හැකි බලය උදාහරණ වේ. මෙය ඇතැම් විචේචකයින් ඉන්දියානු ක්‍රමය අර්ධ සන්ධීය යැයි හැඳින්වීමට බලපා ඇත. කෙසේ වුවත් මෑත කාලයේ හේතු ගනණාවක් නිසා ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ ෆෙඩරල් ලක්ෂණ වැඩි වී ඇත.



Scanned with CamScanner

ඉන් සමහරක් පහත දැක්වේ.

ආ) මධ්‍යම ආණ්ඩුව හසුරුවනු නොලබන දේශපාලන පක්ෂ විසින් ප්‍රාන්ත ආණ්ඩුවල බලය අත්පත් කරගෙන වැඩි ස්වාධීනත්වයක් වෙනුවෙන් සටන් කිරීම.

ආ) ඉන්දියානු දේශපාලනයේ දී බොහෝ කලාපීය දේශපාලන පක්ෂ ප්‍රාන්ත ආණ්ඩුවල බලයට පත්ව ඇත. ඒවා කලාපීය ස්වායත්තතාවට කැප වූ පක්ෂ වේ.

ඇ) මෑත කාලයේ සිදු වූ වැදගත් සංවර්ධනයක් නම් ප්‍රාන්ත ආණ්ඩුවලට වැඩි ස්වායත්තතාවක් හිමිවන ආකාරයට ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකතනය කිරීමයි. ඒ මගින් මධ්‍යම ආණ්ඩුව ප්‍රාන්ත ආණ්ඩුවලට ඇඟිලි ගැසීම වළකා ඇත. මධ්‍යම ආණ්ඩුව විසින් කලාපීය පක්ෂ හෝ විපක්ෂයේ දේශපාලන පක්ෂ බලය දරනු ලබන ප්‍රාන්ත ආණ්ඩු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 352 වගන්තිය අනුගමනය කරමින් විසුරුවා හැරීම වළක්වා ඇත.

තවද මධ්‍යම ආණ්ඩුවත් හා ප්‍රාන්ත ආණ්ඩුවත් යන දෙක අතර ඇතිවන ගැටලු විනිශ්චයේ දී ප්‍රාන්ත ආණ්ඩුවලට හිතකර වන ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන අර්ථකතනය කර ඇත. මෙයින් ඉන්දියානු ක්‍රමයේ සන්ධීය ලක්ෂණ ශක්තිමත් වී ඇත.

අසමමිතික බලහවුල්කාරීත්වය ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ තවත් විශේෂ ලක්ෂණකි. ඉන් අදහස් වන්නේ සන්ධීය ආණ්ඩුක්‍රමයේ සෑම කොටස්කරුවකුටම සමාන මට්ටමක බලතල හිමි නොවන බවයි. විශේෂ හේතු නිසා සමහර ප්‍රාන්තවලට විශේෂ බලතල ලැබී ඇත. උදාහරණ ලෙස පංජාබ්, ගෝවර්, ඇසෑම්, මිසොලාම්, මනිපූර් සහ සිකිම් යන ප්‍රාන්තවලට වැඩි බලතල ලැබී තිබේ. ඊට හේතු වී ඇත්තේ ජනවාර්ගික ජාතිකවාදී ව්‍යාපාර හා වෙන්වී යෑම සඳහා පැවති වාර්ගික වියවුල්කාරී තත්ත්වයන් ය.

විරෝධතා මධ්‍යයේ උවත් ඉන්දියාවට සාපේක්ෂ වශයෙන් සාමකාමී ව නව ප්‍රාන්ත බිහිකිරීමට හැකියාව ලැබී ඇත. 2004 දී චත්තිස්ගා හා උත්තරකාන්ද් යන ප්‍රාන්ත බිහිකළේ ය. 2014 දී පවත්නා ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයෙන් තෙලංගානා ප්‍රාන්තය බිහිකළේ ය. එමගින් පැහැදිලි වන්නේ පවත්නා ප්‍රාන්තවල දේශසීමා වෙනස් කරමින් වැඩි ප්‍රචණ්ඩත්වයකින් තොරව නව ප්‍රාන්ත බිහිකිරීමට ඉන්දියානු සන්ධීය ක්‍රමය සතු නම්‍යභාවයයි.

අපට තවදුරටත් නිරීක්ෂණය කළ හැකි ලක්ෂණයක් වන්නේ ප්‍රාන්ත ආණ්ඩු මුලින් සිතුවාට වඩා ප්‍රාදේශීය ස්වායත්තතාවක් සතු කරගනිමින් විකාශනය වීමයි. ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ සන්ධීය ලක්ෂණ ස්ථාවරවීමට බලපා තිබෙන කරුණක් වන්නේ ඉන්දියානු ආණ්ඩුක්‍රමයෙන් හා ව්‍යවස්ථාවෙන් විවිධත්වය හා බහුත්වාදය නිරූපණය විය යුතු යැයි පොදු ජනතාව විසින් පිළිගැනීමයි. ජාත්‍යන්තර අත්දැකීමක් වන්නේ සන්ධීය ක්‍රමය තුළ ශක්තිමත් මධ්‍යම ආණ්ඩු බිහිවීමයි.

ඉන්දියානු අර්ධ සන්ධීය ක්‍රමයට ඓතිහාසිකව බලපෑ හේතුවක් වන්නේ නිදහස ලබාගන්නා අවස්ථාවේ දී ඉන්දියාව හා පාකිස්ථානය ලෙස භෞමික වශයෙන් කැඩියාමයි. එබැවින් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අවධාරනයක් ඉන්දියානු ක්‍රමය තබා ඇත. තවද ඉන්දියානු සන්ධීය ක්‍රමය බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසින් බිහිකරනු ලැබූ මධ්‍යගත පරිපාලන ක්‍රමය අඛන්ඩව පවත්වාගෙන යයි.

...............................................................

**9. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය වීමට බලපාන ප්‍රධාන නිර්ණායක පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 20)**

මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කරන ප්‍රධාන සාධක පිළිබඳව ශිෂ්‍යයාගේ දැනුම සහ විස්තර කිරීමේ හැකියාව තක්සේරු කිරීමට උත්සාහ කරයි. එය සංක්ෂිප්ත වශයෙන් රටක විදේශ ප්‍රතිපත්තියේ අභ්‍යන්තර හා බාහිර නිර්ණායක පිළිබඳ යම් න්‍යායික දැනුමක් ද අපේක්ෂා කරයි.

**හැඳින්වීම: (ලකුණු 03)**

රටක විදේශ ප්‍රතිපත්තිය විවිධ අභ්‍යන්තර හා බාහිර සාධක මත තීරණය වේ.



Scanned with CamScanner

ජාතික බලය; භූ-දේශපාලන සාධක; සමාජ සංස්කෘතික සාධක; ජාතික ආර්ථික අභිලාෂයන් සහ ගතිකයන්; පාලන තන්ත්‍රයේ දේශපාලන න්‍යාය පත්‍රය; විදේශ ප්‍රතිපත්ති ප්‍රභූන්ගේ පුද්ගලික සහ මතවාදී තේරීම්; මහජන මතය; සහ සමාජ සංස්කෘතික සාධක විදේශ ප්‍රතිපත්තියට බලපාන වැදගත් **අභ්‍යන්තර සාධක** වේ. කලාපීය සහ ගෝලීය බල තුලනය; ජාත්‍යන්තර දේශපාලන, ආර්ථික සහ උපාය මාර්ගික පරිසරයේ වෙනස්වීම්; ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික සබඳතා සඳහා අදාළ රාජ්‍යයේ අභිරුචිය ; රාජ්‍යවල ශක්‍යතා බෙදීගොස් ඇති ආකාරය; යන සාධක රටක විදේශ ප්‍රතිපත්තියේ **බාහිර නිර්ණායක** ලෙස හඳුනාගත හැකිය.

**අන්තර්ගතය: (ලකුණු 15)**

ජාතික බලය විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීමෙහි ලා ප්‍රමුඛ බලපෑමක් කරයි. රටක් දැවැන්ත යුධ ශක්තියකින්, ආර්ථික ශක්තියකින් සහ දේශපාලන ස්ථාවරත්වයෙන් සන්නද්ධ වූ විට, අධිපතිවාදී සහ උද්වේගකර විදේශ සබඳතා පවා දියත් කිරීමට පසුබට නොවනු ඇත. කෙසේ වෙතත්, කුඩා රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, එහි ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී මෙම සාධකය තීරණාත්මක වී නොමැත.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ උපාය මාර්ගික වශයෙන් වැදගත් ස්ථානයක පිහිටි දූපත් රාජ්‍යයකි. ඉතිහාසය පුරා එහි විදේශ ප්‍රතිපත්තිය සඳහා භූ-දේශපාලනික සාධක තීරණාත්මක විය. මේ නිසාම වර්තමානයේදී ද කලාපීය බලවතුන්ගේ (ඉන්දියාව, චීනය) සහ මහාද්වීපික බලවතුන්ගේ (ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව) අඛණ්ඩ බලපෑම විදේශ ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී කළමනාකරණය කළ යුතු වැදගත් සාධක වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික හා වෙළඳ අවශ්‍යතා එහි සමකාලීන විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේ වඩාත් තීරණාත්මක සාධක බවට පත්ව ඇත. මෑත කාලයේ අනුගමනය කරන ලද ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා යන දෙකම ආර්ථික හා වෙළඳ අභිලාෂයන් විසින් අධිනිශ්චය කෙරෙනු දක්නට ලැබේ. රට ද්විපාර්ශ්වික (චීනය, ඉන්දියාව සහ වඩාත් මෑතකදී තායිලන්තය සමඟ) සහ බහුපාර්ශ්වික (SAPTA, SAFTA) වෙළඳ ගිවිසුම් කිහිපයක් සඳහා මුල පිරීම් සිදු කර අත්සන් කර හෝ දැනටමත් ස්ථාපිත කර හෝ ඇත. වත්මන් ආර්ථික අර්බුදය විසින් බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය සපයන්නන් (චීනය, ඉන්දියාව, IMF, ADB) සමඟ කරන අඛණ්ඩව ගනුදෙනු කිරීම්වලට විදේශ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාව ලබාදීමට රාජ්‍යයට බල කෙරී ඇත.

විදේශ ප්‍රතිපත්ති ප්‍රභූන්ගේ (foreign policy elites) පුද්ගලික සහ මතවාදී අභිරුචිය මෙන්ම මහජන මතය ද රටක විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය හැඩගැස්වීමට වැදගත් සාධක වේ. නිදහස ලැබීමේ සිට 1956 දක්වා ශ්‍රී ලංකාව වඩාත් සම්බන්ධ වූයේ මහා බ්‍රිතාන්‍යය සමඟ ය. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසුවත් මහා බ්‍රිතාන්‍යය සමඟ සිය ආරක්ෂක සහ උපායමාර්ගික සබඳතා දිගටම සිදු කළාය. කෙසේ වෙතත්, 1956 න් පසු පාලන තන්ත්‍ර වෙනස්වීම් සමඟ එහි විදේශ ප්‍රතිපත්ති ස්ථාවරය සම්පූර්ණයෙන්ම වෙනස් විය. ශ්‍රී ලංකාව 1977 දක්වා නොබැඳි ව්‍යාපාරයේ ප්‍රබල ආධාරකරුවෙකු විය. සමාජවාදී රටවල් (රුසියාව, චීනය සහ කියුබාව) සමඟ එහි ද්විපාර්ශ්වික සබඳතා එම කාලය තුළ ශක්තිමත් විය.

1977 සිට 1987 දක්වා එහි ප්‍රධාන උනන්දුව වූයේ "බටහිරට සමීප වීමයි ". පශ්චාත් නිදහස් ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදය සමඟ එතරම් සමීපව කටයුතු කළේ 1980 දශකයේදීය. 2005 සිට 2015 දක්වා කාලය තුළ චීනය රටට සමීපතම බාහිර බලවතා විය.

මහජන මතය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මුඛ්‍ය සාධකයක් නොවූවත්, විශේෂයෙන්ම බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල විදේශ ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළ බලගතු භූමිකාවක් ඉටු කරයි.
ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති ඉතිහාසයේ තායිලන්තය, මියන්මාරය සහ මැදපෙරදිග සමඟ ඇති රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආගමික සහ වාර්ගික සාධක වැනි සමාජ-සංස්කෘතික නිර්ණායක මගින් ප්‍රමුඛ කොට තිබේ.

කලාපීය සහ ගෝලීය සන්දර්භය තුළ බල සිතියමේ වෙනස්වීම් ජාතීන්ගේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේ අත්‍යවශ්‍ය නිර්ණායක වන්නේය. ඉන්දියානු සාගර කලාපයේ (IOR) උපායමාර්ගික සහ



Scanned with CamScanner

දේශපාලනමය වර්ධනයන් සහ ගෝලීය තලයේ (චීනය ගෝලීය බලවතෙකු ලෙස නැගීමත් සමඟ) බහු-ධ්‍රැව බලතුලනයක සිට ද්වි-ධ්‍රැව බල තුලනයක් දක්වා වන බල සංක්‍රමණය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ වැදගත් බාහිර නිර්ණායක ලෙස සඳහන් කළ හැකිය.

ප්‍රකට ව්‍යුහාත්මක යථාර්ථවාදියෙකු වන කෙනත් වොල්ට්ස් (Kenneth Waltz) ප්‍රකාශ කළ පරිදි, රාජ්‍යවල ශක්‍යතා බෙදී ගොස් ඇති ආකාරය (distribution of capabilities) ජාතීන්ගේ විදේශ ප්‍රතිපත්තිවල හැඩය තීරණය කිරීමෙහි ලා නොතිත් බලපෑමක් සිදු කරයි. විශේෂයෙන්ම මහ බලවතුන් සමඟ ද්විපාර්ශ්වික සබඳතා පැවැත්වීමේදී ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයන්ට "පසුපස එල්ලී යාමට" (bandwagoning) සහ ආරක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කිරීමට බල කෙරේ.

සාරාංශය (ලකුණු 02)
ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය බහුවිධ අභ්‍යන්තර හා බාහිර නිර්ණායකයන්ගේ පිළිබිඹුවකි. කෙසේ වෙතත්, ජාතික හා ජාත්‍යන්තර පර්යාය තුළ සිදුවන වර්ධනයන් අනුව එම නිර්ණායක ගතික ස්වභාවයක් ගතහැකි බව සහ වෙනස් වීමට යටත් බව සඳහන් කළ හැකිය.

(මෙම ප්‍රශ්නය විවෘත අන්තයක් සහිත වන බැවින් ඓතිහාසිකව සහ සමකාලීනව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීමට බලපෑ වෙනත් කාරණා සඳහන් කොට තිබුණොත්, ඇගයීමේදී ඒ පිළිබඳ සැලකිල්ල යොමු කළ යුතුය)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ගැටුම් නිරාකරණය

ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය සහ ගැටුම් නිරාකරණය කිරීමේ මාධ්‍යයන් විස්තර කිරීමේ හැකියාව පිළිබඳ ශිෂ්‍යයාගේ අවබෝධය තක්සේරු කිරීමට මෙම ප්‍රශ්නය අපේක්ෂා කරයි.
ගැටුම් සහ ගැටුම් නිරාකරණය අධ්‍යයනය කිරීම දේශපාලන විද්‍යාවේ විෂය පථය තුළ සාපේක්ෂව නව ක්ෂේත්‍රයක් ලෙසින් හඳුනා ගැනේ. එය දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ අනන්‍ය කොටසක් බවට පත්වන්නේ 1980 ගණන්වල මුල් භාගය තරම් මෑතක ය. විශේෂයෙන් පශ්චාත් නිරවි සංග්‍රාම අවධියේදී ලෝක පරිමාණ ව රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් (intra-state conflicts) බහුල වශයෙන් ව්‍යාප්ත වීමත් සමඟ ජනප්‍රිය අධ්‍යයන සම්ප්‍රදායයක් ලෙස වර්ධනය වූයේය.

ගැටුම් නිරාකරණය දීර්ඝ ක්‍රියාවලියකි. ගැටුමක් සම්පූර්ණයෙන් විසඳා ගැනීම අපහසු වුවද, ගැටුමේ අහිතකර ස්වභාවය වඩාත් ධනාත්මක අවධියකට පරිවර්තනය කළ හැකිය. ඒ අර්ථයෙන් ගැටුමක් සබැඳිව කටයුතු කිරීම සඳහා විධි ක්‍රම කිහිපයක් ප්‍රවර්ධනය කෙරේ. එම උපාය මාර්ග, පූර්ව අනතුරු ඇඟවීම; ගැටුම් වැළැක්වීම; ගැටුම් කළමනාකරණය; ගැටුම් පරිවර්තනය; පශ්චාත් ගැටුම් අවධිය තුළ සාමය ගොඩනැගීම; සහ ගැටුම් නිරාකරණය; වශයෙන් හැඳින්විය හැකි වන්නේය.

ගැටුම් පූර්ව අනතුරු ඇඟවීමේ ප්‍රධාන අදහස නම්, විය හැකි ගැටුම් පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා මගින් හඳුනාගත හැකි බවත්, හැකි ඉක්මනින් ඒවාට ආමන්ත්‍රණය කිරීම ගැටුම් සමඟ ගනුදෙනු කිරීමේ සාධනීය ක්‍රමයක් බවත් ය. ගැටුමේ සංඥා, එය සිදුවිය හැකි ස්ථාන සහ ගැටුමේ පාර්ශ්වකරුවන් හඳුනා ගැනීමෙන් පසු, වැළැක්වීමේ ක්‍රම ක්‍රියාත්මක කළ හැකිය.

ගැටුම් වැළැක්වීම යනු ගැටුමට හේතු, ගැටුම් ස්ථාන සහ පාර්ශවයන් හඳුනා ගැනීම සහ ගැටුම් ඇතිවීමේ මුල් අවධියේදී ඒවා විසඳීමට පියවර ගැනීමයි. සරළ වැළැක්වීම යනු ගැටුම් ප්‍රචණ්ඩත්වය කරා එළැඹීම වැළැක්වීමයි. ගැඹුරු වැළැක්වීම යනු ගැටුමේ මූල හේතු සොයා ගැනීම සහ එය උත්සන්න වීම වැළැක්වීමයි.



Scanned with CamScanner

ගැටුම් කළමනාකරණය ගැටුමේ තීව්‍රතාව සීමා කරන අතර එය ප්‍රචණ්ඩකාරී ස්වරූපයකට ඇතුළු වීම වළක්වයි.

ගැටුම් පරිවර්තනය යනු ගැටුමේ ව්‍යුහයන්, ගතිකතා සහ මූල හේතු වෙනතකට යොමු කිරීම මගින් ගැටුම විසඳීමට පහසු අදියරකට පරිවර්තනය කිරීමයි. සාර්ථක ගැටුම් පරිවර්තනයක් සඳහා ගැටුමේ පාර්ශ්ව, ගැටුමට තුඩු දෙන හේතු, ගැටුම විසින් සාක්ෂාත් කිරීමට අපේක්ෂා කරන අරමුණු සහ පාර්ශ්වකරුවන් තුළ පවතින විසටන වෙනස් කිරීමක් අවශ්‍ය වේ.

සාම ගිවිසුමක් හෝ ගැටුමේ සන්නද්ධ ස්වරූපය අවසන් කිරීම ගැටුම විසඳීම සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසි පමණක් සපයනු ඇත. පශ්චාත්-ගැටුම් අවධිය තුළ සාමය ගොඩනැගීමේ අරමුණ නිරාකරණ ක්‍රියාවලියෙන් පසු නැවත නැවත ගැටුම් ඇතිවීම වැළැක්වීමයි.
ගැටුම් නිරාකරණය සඳහා බහුලව භාවිත වන විධි ක්‍රම හතරක් ඇත.

සහමන්ත්‍රණය යනු ගැටුමකට සම්බන්ධ පාර්ශ්වයන් එය විසඳීම සඳහා යොදා ගන්නා සාකච්ඡා ක්‍රියාවලියකි. ගැටුමේ පාර්ශවයන් සාකච්ඡා ක්‍රියාවලියක දී අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ හෝ හවුල් කොන්දේසිවලට පැමිණීමට උත්සාහ කරයි.

මැදිහත්කරණය යනු ගැටුමේ පාර්ශවවලට සංවේදී කාරණා සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය හැකි සම්මුතියකට පැමිණීමට උපකාර කිරීම සඳහා ගැටුම තුළට තෙවන පාර්ශ්වයක මැදිහත්වීමකි.
සාර්ථක සහමන්ත්‍රණයකින් සහ/හෝ මැදිහත්කරණයකින් පසුව, ගැටුම්කාරී පාර්ශ්වයන්ට සාම ගිවිසුමකට එකඟ විය හැකිය.

සාමය ගොඩනැගීම යනු පුනරාවර්තන ගැටුම් වැළැක්වීම හා ගැටුම් සඳහා කාරක වූ මූලයන් ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් දිගුකාලීන ක්‍රියාවලියකි.

..............................................................................................................................................

**(ii) නීතියේ ආධිපත්‍යය**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරෙන්නේ නීතියේ ආධිපත්‍යය, එහි අත්‍යවශ්‍ය සංරචක සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම පිළිබඳ ශිෂ්‍යයාගේ අවබෝධය තක්සේරු කිරීමට ය.
නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ අතිමූලික මූලධර්මයක් ලෙස සැලකේ. නීතියේ ආධිපත්‍යය නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදය පැවතිය නොහැකි බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි.

නීතියේ ආධිපත්‍යය යන්නෙහි සරල අර්ථය නම් නීතිය පාලකයන්ට මෙන්ම පාලිතයන්ටද එකසේ ක්‍රියාත්මක විය යුතුය යන අදහසයි. එය තව දුරටත්, නීති නිර්මාණය කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පාලකයින් අතර සබඳතා පවා නීත්‍යානුකූලව නියාමනය කර ඇති බව ගම්‍ය කරයි. එනයින්, කිසිවකු නීතියට ඉහළින් නොසිටින බවයි.

බ්‍රිතාන්‍ය නීතිවේදියෙකු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා න්‍යායවේදියකු වන ඒ. වී. ඩයිසි (Albert Venn Dicey) ඔහුගේ Law of the Constitution හි දී නීතියේ ආධිපත්‍යය විස්තර කළේ රජයේ හෝ එහි නිලධාරීන්ගේ අභිමතානුසාරී අභිලාෂයන්ට ඉහළින් නීතියේ ආධිපත්‍යය, නීතිය ඉදිරියේ සමානාත්මතාව සහ නීතියට අනුගත වීමයි තැබීමයි.

නීතියේ ආධිපත්‍යය පිළිබඳ මූලධර්මය තුළ පහත සඳහන් සංරචක හඳුනා ගත හැකිය.

- ඉහළම දේශපාලන අධිකාරිය ඇතුළු රජයේ සියලුම නිලධාරීන් නීතියට ඉහළින් නොසිටියි. ඒ වෙනුවට ඔවුන් සියල්ල රටේ නීතියට යටත් වේ.
- නීති සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීමට රජය සතු බලය පුද්ගල නිදහස ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති ව්‍යවස්ථාමය සීමාවන්ට යටත් විය යුතුය.
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, වධහිංසා පැමිණවීම සහ වැරදි දඬුවම් දීම වැනි ක්‍රියාවන් මගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් රජය වැළකිය යුතුය.



Scanned with CamScanner

- රාජ්‍ය අධිකාරියේ සීමාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලිව ප්‍රකාශ කළ යුතු අතර එකී සීමා මායිම් අධිකරණ තීරණ මගින් සුරක්ෂිත කළ යුතුය.
- ආණ්ඩුවේ සෙසු ආයතනවලින් අධිකරණය ආයතනික වශයෙන් වෙන් කිරීම නීතියේ ආධිපත්‍යයෙහි වැදගත් ලක්ෂණයක් ලෙස සාමාන්‍යයෙන් සැලකේ.

නීතියේ ආධිපත්‍යය රාජ්‍යයට සහ ආණ්ඩුවට පමණක් සීමා නොවේ. පුරවැසියන් නීතිමය සම්මතයන් සමග එකඟ වීම සහ ඒවාට ගරු කිරීම ද අවශ්‍ය වේ. ඔවුන්ගේ අවශ්‍යතා සහ අභිලාශ සබැඳි අන් අය සමග ගැටෙන විට, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් මොනවාද යන්න පිළිබඳ නීතිමය ප්‍රතිපාදන පිළිගත යුතුය.

නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර අන්තර් සම්බන්ධය ගැන සාකච්ඡා කරන විට, "නීතිය මගින් පාලනය" (rule by the law) එනම් නීතිය යනු රජයේ උපකරණයක් වන අතර රජය නීතියට වඩා ඉහළින් යන ඇඟවුම සහ "නීතියේ ආධිපත්‍යය" (rule of law) එනම්, ආණ්ඩුව ඇතුළු සමාජයේ සෑම දෙනාම නීතියට බැඳී සිටින බවට වන ඇඟවුම අතර වෙනස අවබෝධ කරගැනීම ඉතා වැදගත් ය.

නීතියේ ආධිපත්‍යය පිළිබඳ මූලධර්මය ඇතැම් ප්‍රතිමානීය ඇගයුම් ද ස්පර්ශ කරයි. නිදහස, සමානාත්මතාව, මානව ගරුත්වය සහ ඉවසීම එවැනි ප්‍රතිමානීය වටිනාකම් වේ.

..............................................................................

**(iii) ශ්‍රී ලංකාව සහ SAARC (දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංගමය).**

මෙම ප්‍රශ්නයෙන් දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංගමය පිළිබඳ ශිෂ්‍යයාගේ දැනුම, ප්‍රධාන කලාපීය බහුපාර්ශ්වික අන්තර් රාජ්‍ය සංවිධානය ලෙස එහි වැදගත්කම සහ සාර්ක් සංවිධාන පද්ධතිය තුළ ශ්‍රී ලංකාවේ කාර්යභාරය තක්සේරු කිරීමට අපේක්ෂා කෙරේ.

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය (SAARC) යනු දකුණු ආසියාවේ කලාපීය බහුපාර්ශ්වික අන්තර් රාජ්‍ය සංවිධානය සහ දකුණු ආසියා රාජ්‍යවල භූ දේශපාලන සංගමයයි. සංවිධානයේ ප්‍රධාන අරමුණු වන්නේ සාමාජික රටවල් අතර ආර්ථික, සහ සමාජ සංස්කෘතික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය වර්ධනය කිරීමයි.

1985 දෙසැම්බර් 8 වන දින බංග්ලාදේශයේ ඩකා හිදී සාර්ක් ප්‍රඥප්තියට අත්සන් කිරීමෙන් සම්මුතිගත වීමත් සමග SAARC පිහිටුවා ගැනිණි. එය දැනට සාමාජික රටවල් අටකින් සමන්විත වේ (ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව). සංගමයේ ලේකම් කාර්යාලය 1987 ජනවාරි 17 වන දින නේපාලයේ කත්මණ්ඩු හි පිහිටුවන ලදී.

SAARC හි ආරම්භක සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව කලාපීය සංවිධානය පිහිටුවීමේදී ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය. දකුණු ආසියාතික රටවල් අතර සහයෝගීතාව පිළිබඳ අදහස සම්මන්ත්‍රණ තුනකදී සාකච්ඡා කෙරිණි. ඒවා නම්: 1947 අප්‍රේල් මාසයේදී නවදිල්ලියේ පැවති ආසියානු සබඳතා සමුළුව; 1950 මැයි මාසයේදී පිලිපීනයේ බගුවෝ සමුළුව; සහ 1954 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ පැවති කොළඹ බලවතුන්ගේ සමුළුවයි (Asian Relations Conference held in New Delhi in April 1947; the Baguio Conference in the Philippines in May 1950; and the Colombo Powers Conference held in Sri Lanka in April 1954).

ශ්‍රී ලංකාව 1981 අප්‍රේල් මාසයේදී සාර්ක් සඳහා ප්‍රථම නිල රැස්වීමට සත්කාරකත්වය දැක්විය. බංගලාදේශය දකුණු ආසියාව සඳහා කලාපීය සංවිධානයක් යෝජනා කළ විට ශ්‍රී ලංකාව එම යෝජනාව කඩිනමින් අනුමත කළ රාජ්‍ය කිහිපය අතුරින් එකක් විය. කලාපීය සහයෝගීතාවය සඳහා වන පුළුල් ක්ෂේත්‍ර හඳුනාගෙන, 1981 සැප්තැම්බර් මාසයේදී සාර්ක් සංවිධානය ව්‍යුහගත කිරීම සඳහා පැවති දෙවන රැස්වීමේ සත්කාරක රාජ්‍යය වූයේද ශ්‍රී ලංකාවයි.



Scanned with CamScanner

ශ්‍රී ලංකාව 1991 දී 6 වැනි සාර්ක් සමුළුවට, 1998 දී 10 වැනි සමුළුවට සහ 2008 දී 15 වැනි සමුළුවට සත්කාරකත්වය සැපයිය.. 1991 සහ 2006 දී දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ (SAFG හෝ SAF ක්‍රීඩා) සත්කාරක රට වූයේ ද ශ්‍රී ලංකාවයි.

දකුණු ආසියාවේ සුවිශේෂී සහ අවේණික කලා ප්‍රවර්ධනය කිරීම සඳහා සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමට ශ්‍රී ලංකා රජය ඉදිරිපත් විය. ඒ අනුව එය 2009 වසරේ කොළඹ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව ද දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශයේ (SAFTA) සහ දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුමේ (SAPTA) සාමාජිකයෙකි.

තීරුබදු සහන හුවමාරු කර ගැනීම හරහා සාර්ක් කලාපය තුළ අන්‍යෝන්‍ය වෙළෙඳ සහ ආර්ථික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට සහ පවත්වා ගැනීමට සාමාජික රටවලට ඇති අභිලාශය SAPTA මගින් පිළිබිඹු වේ. 1991 දෙසැම්බර් මස කොළඹදී පැවති දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ හයවැනි සමුළුවේදී සාර්ක් රටවල් අතර වෙළෙඳාම ලිබරල්කරණය කිරීමේ අදහස ප්‍රථමයෙන් මතු කළේ ශ්‍රී ලංකාවයි. කෙසේ වෙතත්, SAPTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයන පරිමාව මෙතෙක් සතුටුදායක මට්ටමකට පැමිණ නැත. .

දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය පිළිබඳ ගිවිසුම (SAFTA) වරණාත්මක ගිවිසුමෙන් පසුව වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම තුළින් කලාපීය ආර්ථික ඒකාබද්ධතාව තවදුරටත් වැඩිදියුණු කිරීම අරමුණු කරයි. කෙසේවෙතත් SAFTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයන කටයුතු කෘෂිකාර්මික සහ ප්‍රාථමික නිෂ්පාදන කිහිපයකට සීමා වී ඇත.

SAARC හි වැදගත් බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් වලින් උපරිම අවස්ථා ලබා ගැනීමට ශ්‍රී ලංකාව කැපවිය යුතුය. ඉන්දියාව හෝ පකිස්ථානය සමඟ භෞමික දේශසීමාව බෙදා නොගන්නා සාමාජිකයෙකු ලෙස, SAARC හි සඵලතාව ප්‍රතිසංස්කරණය කිරීමේදී ශ්‍රී ලංකාවට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි බව පුළුල් ලෙස ප්‍රකාශ වේ.

..........................................................................................

(iv) මිශ්‍ර ආණ්ඩුක්‍රම ආකෘතිය

මෙම ප්‍රශ්නයෙන් ආණ්ඩු ක්‍රම ආකෘතියක් ලෙස මිශ්‍ර ආණ්ඩු ක්‍රමය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සහ එහි මූලික ලක්ෂණ පැහැදිලි කිරීමට ඔවුන්ගේ හැකියාව තක්සේරු කිරීම අරමුණු කරයි.

මිශ්‍ර ක්‍රමයක් නොහොත් දෙමුහුම් ක්‍රමයක් (hybrid system of government) යනු ආණ්ඩු ක්‍රම ආකෘති දෙකක හෝ වැඩි ගණනක ලක්ෂණ ඒකාබද්ධ කරමින් නිර්මාණය කරන ආණ්ඩු ක්‍රමයකි . සාමාන්‍යයෙන් මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක් ජනාධිපති සහ පාර්ලිමේන්තු ක්‍රමයේ ලක්ෂණ ඒකාබද්ධ කරයි. ජනාධිපති සහ පාර්ලිමේන්තු ආකෘතිවල ලක්ෂණ ඒකාබද්ධ කරන මිශ්‍ර ආණ්ඩු ක්‍රමයක් අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයකි ලෙසද හැඳින්වේ.

දේශපාලන විද්‍යා විමර්ශනයේදී, අර්ධ-ජනාධිපතික්‍රම පිළිබඳ සංකල්පය පළමුවෙන් විග්‍රහ කරන ලද්දේ ප්‍රංශ දේශපාලන විද්‍යාඥ මොරිස් ඩුවර්ජර් (Maurice Duverger) විසිනි. ඔහු පැහැදිලි කළ පරිදි, අර්ධ-ජනාධිපති පාලන තන්ත්‍රයක් සංලක්ෂිත වූයේ 'රාජ්‍ය නායකයා සර්වජන ඡන්ද බලයෙන් සෘජුවම තේරී පත් වීමෙන් සහ සාමාන්‍ය පාර්ලිමේන්තු පාලන තන්ත්‍රයක් තුළ රාජ්‍ය නායකයෙකුට හිමි බලයට වඩා විස්තෘත බලතල ඔහු සතුව තිබීමයි. කෙසේ වෙතත්, ඒ තුළ ආණ්ඩුව සමන්විත වන්නේ අගමැතිවරයා විසින් පිහිටුවන කැබිනට් මණ්ඩලයකින් සහ පාර්ලිමේන්තුව විසින් බලයෙන් පහ කළ හැකි ඇමතිවරුන් සමූහයකගෙනි. ඔහු පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට ඇති හැකියාව, අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් ලෙස එක් කළේය.

පැට්‍රික් ඕ'නීල් (Patrick O'Neil) ප්‍රකාශ කරන්නේ අර්ධ ජනාධිපති පාලනයක් යනු විධායක බලය ජනාධිපති සහ අගමැති අතර බෙදී ඇති නමුත් ජනාධිපතිවරයාට විස්තෘත බලතල හිමි ආණ්ඩුක්‍රමයක් බවයි.



Scanned with CamScanner

ජියෝවන්නි සාතෝරි (Giovanni Sartori) මිශ්‍ර ක්‍රමයක් (අර්ධ-ජනාධිපති ක්‍රමයක්) පිළිබඳ වඩාත් සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් සපයයි: ඔහුට අනුව,

"පහත සඳහන් මූලිකාංග හෝ ලක්ෂණ එකම ආණ්ඩුක්‍රමයක් තුළ දක්නට ලැබේනම් එය අර්ධ-ජනාධිපති ආණ්ඩුක්‍රමයක් වේ:

- රාජ්‍ය නායකයා (ජනාධිපති) ස්ථාවර ධුර කාලයක් සඳහා මහජන ඡන්දයෙන් තේරී පත් වේ.
- විධායකය තුළ ද්විත්ව අධිකාරියක් නිර්මාණය කරමින් රාජ්‍ය නායකයා විධායක බලය අගමැතිවරයා සමග බෙදා ගනී.
- ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවෙන් ස්වාධීන වන නමුත් තනිව හෝ සෘජුව පාලනය කිරීමට ඔහුට අයිතියක් නැත. එබැවින් ඔහුගේ කැමැත්ත ඔහුගේ ආණ්ඩුව මගින් ප්‍රකාශ කළ යුතුය.
- අගමැති සහ ඔහුගේ කැබිනට් මණ්ඩලය ජනාධිපතිගෙන් ස්වාධීන වන අතර ඔවුහු පාර්ලිමේන්තුව මත යැපෙති. ඒ තුළ ඔවුන් පාර්ලිමේන්තු විශ්වාසය තහවුරු කිරීමට හෝ විශ්වාසභංගයට (හෝ දෙකටම) යටත් වන අතර ඒ ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තු බහුතරයකගේ සහාය මත රඳා පවතී.
- අර්ධ-ජනාධිපති ක්‍රමයෙහි පවතින ද්විත්ව විධායක ව්‍යුහය විධායකය තුළම වෙනස් සමතුලිතතාවන් සහ බලය අත්කරගැනීමේ ස්වභාවයෙහි වෙනස්වීම් සඳහා ඉඩ සලසයි.

සාමාන්‍යයෙන්, අර්ධ-ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ ලෙස පහත කාරණා තේරුම් ගත හැකිය.

- පාර්ලිමේන්තුවෙන් ස්වාධීන විධායක බලතල සහිත ජනාධිපතිවරයෙක් සිටී.
- ජනාධිපතිවරයා සෘජුවම මහජන ඡන්දයෙන් තේරී පත් වේ.
- ජනාධිපතිවරයාට සැලකියයුතු විධායක බලයක් ඇත (කිසිසේත් චාරිත්‍රානුකූල බලතලවලට සීමා නොවේ).
- ජනාධිපතිවරයා සහ අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් මණ්ඩලය විධායක බලයේ සමාන්තර මධ්‍යස්ථාන වේ.
- අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැති වන අතර ඇය පාර්ලිමේන්තුවට වග කිව යුතුය

1958 දී ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිහිටුවීමෙන් පසු දෙමුහුන් ක්‍රමයේ මූලික ලක්ෂණ දේශපාලන විද්‍යා විමර්ශනයේ කතිකාමය තලයට පැමිණියේය. ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 සහ 21 වැනි වගන්තිවල සඳහන් වන්නේ ජනාධිපතිවරයා රාජ්‍යයේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයෙකු වන අතර, අගමැති රජයේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පිළිබඳව තීරණය කිරීමේ බලය හිමි තැනැත්තා වන බවය.

නැගෙනහිර යුරෝපයේ සහ පැරණි සෝවියට් සමූහාණ්ඩුවට අයත් රාජ්‍යයන්හි වඩාත් ජනප්‍රිය ආණ්ඩුක්‍රම ආකෘතිය ලෙස අර්ධ-ජනාධිපති ක්‍රමය ඉස්මතු වී ඇත. රොබට් එල්ගී (Robert Elgie) රටවල් 42ක් අර්ධ-ජනාධිපති ක්‍රම සහිත ආණ්ඩුක්‍රම ලෙස ලැයිස්තුගත කර ඇත.

ඒ අතරට අප්‍රිකාවෙන් ඇන්ගෝලාව, බෙනින්, ඝානාව සහ මාලි; ඇමෙරිකානු රාජ්‍ය ලෙස ඩොමිනිකන් ජනරජය, ගයනාව සහ හයිටි, ආසියාවෙන් ශ්‍රී ලංකාව, මාලදිවයින සහ දකුණු කොරියාව; පැරණි සෝවියට් සංගමයේ පාලන තන්ත්‍රවලින් බල්ගේරියාව, පෝලන්තය සහ රුමේනියාව; නැගෙනහිර යුරෝපයෙන්, බෙලරුස්, සහ ලිතුවේනියාව; සහ බටහිර යුරෝපයෙන් ඔස්ට්‍රියාව, ෆින්ලන්තය, පෘතුගාලය සහ ප්‍රංශය ඇතුළත් කර ඇත.

(කෙසේ වෙතත්, සමහර සිසුන්, අර්ධ-ජනාධිපති පාලන ක්‍රමයක උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ 1978 ක්‍රමයේ ලක්ෂණ පිළිබඳව පුළුල් ලෙස විස්තර කළ හැකිය).

මිශ්‍ර ආණ්ඩු ක්‍රමයේ ශක්තීන් සහ දුර්වලතා පිළිබඳ මිශ්‍ර කතිකාවන් ගොඩ නැගී තිබේ. එය ජනාධිපතිවරයාගේ අධිකාරය සම්බන්ධයෙන් වඩාත් ශක්තිමත් සංවරණ සහ තුලන උපකරණ සපයන ක්‍රමයක් ලෙස පිළිගෙන ඇත. කෙසේ වෙතත්, විශේෂයෙන්ම, වෙනස් දේශපාලන පක්ෂවලින් ජනාධිපති සහ අගමැති බලයට පත් වූ අවස්ථාවල ජනාධිපතිවරයා සහ ආණ්ඩුව අතර ගැටුම් බහුලව වාර්තා වීම ඒ පිළිබඳ ජනප්‍රිය විවේචනයක් වශයෙන් පවතී.



Scanned with CamScanner

**(v) වාර්ගික දේශපාලන පක්ෂ.**

මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් සහිතව වාර්ගිකත්වය පදනම් කරගත් දේශපාලන පක්ෂ පිළිබඳ සිසුන්ගේ දැනුම තක්සේරු කිරීම අරමුණු කරයි.
ජනවාර්ගික පක්ෂ නිර්වචනය කරනු ලබන්නේ ඉඳුරාම යම් ජනවාර්ගික ප්‍රජාවක හෝ ජනවාර්ගික ප්‍රජාවන් සමූහයක අවශ්‍යතා පිළිබඳ නියෝජිතයන් ලෙස ඡන්දදායකයින් වෙත ප්‍රවේශ වන දේශපාලන පක්ෂ ලෙස ය.
බහු සංස්කෘතික සහ බහු වාර්ගික සමාජ ජනවාර්ගික පක්ෂ සංවර්ධනය සඳහා තිඹිරි ගෙයක් බවට පත් වේ. ජනවාර්ගික පක්ෂ කෙරෙහි ඇති උනන්දුව කූඨ ප්‍රාප්තියට පත් වූයේ පශ්චාත් නිරවි සංග්‍රාම අවධියේ ශිෂ්ටාචාර අතර ගැටුම් පිළිබඳ විවාද සමඟිනි.
ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය වාර්ගික පක්ෂ කිහිපයකින් සමන්විත වේ. දේශපාලන බලමුලු ගැන්වීමේදී ජනවාර්ගික අනන්‍යතාවේ භූමිකාව පිළිබඳ කාරණාව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑත කාලීනව ඉස්මතු වූවක් නොවේ. එය ලංකාවේ සංවිධිත දේශපාලන සංවිධාන වර්ධනය වීම ආරම්භ වූ 1930 ගණන්වල සිටම පැවති දේශපාලන ප්‍රවණතාවක් වන අතර නිදහසින් පසු එය ප්‍රකාශමාන වීම වඩාත් වර්ධනය වූයේය.

1950 ගණන්වල මුල් භාගයේ දේශපාලන පක්ෂවල පුළුල් වීම සමඟ වාර්ගික පක්ෂ ඉස්මතු වීමේ විභවය වැඩි දියුණු විය. ෆෙඩරල් පක්ෂය සහ දෙමළ කොංග්‍රසය දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් ඇතුළු දෙමළ බස වහරන ජනතාවගේ අවශ්‍යතා නියෝජනය කළ පළමු වාර්ගික පක්ෂ විය. ඊට ප්‍රත්‍යාසන්නව ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විශේෂයෙන් සිංහල ඡන්ද දායකයින් වෙත ආමන්ත්‍රණය කරන පක්ෂයක් ලෙස මතු වූ නමුත් අනෙකුත් ජනවර්ගවල ඡන්දදායකයින් බැහැර කර නැත.

1980 දශකයෙන් පසුව එළැඹි ජනවාර්ගික ගැටුම් සන්දර්භය තුළ වාර්ගික පක්ෂවල වර්ධනය වඩාත් කැපී පෙනුණි. එකම ජනවර්ගයක් තුළ ඇති බෙදීම් ආමන්ත්‍රණය කළ පක්ෂ සහ ආගමික මත පදනම් වූ පක්ෂ ඇතුළු බහුවිධ ජනවාර්ගික පක්ෂ සමූහයක නැගීමට ද එය මග පෑදීය.

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය 1987 දී පිහිටුවනු ලැබුවේ මුස්ලිම් වාර්ගික පක්ෂයක් වශයෙනි. උඩරට වතුකරයේ දෙමළ ප්‍රජාවගේ ප්‍රධාන දේශපාලන පක්ෂය ලෙස ලංකා කම්කරු කොංග්‍රසය කටයුතු කර ඇත. කඳුරට ජනතා පෙරමුණ ද බිහිවූයේ ඊට සමාන සන්දර්භයක් තුළ ය. සිංහල-බෞද්ධ මතවාදී පක්ෂ කිහිපයක් ද වර්තමානයේ දක්නට ලැබේ . ජාතික හෙළ උරුමය, පිවිතුරු හෙළ උරුමය සහ අපේ ජනබල පක්ෂය ඒ සඳහා ජනප්‍රිය උදාහරණ වේ.

1980 දශකයේ දී, දෙමළ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් නව දෙමළ දේශපාලන පක්ෂ කිහිපයක් උතුරු හා නැගෙනහිර පළාත් ආශ්‍රිතව බිහි විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් මුලින් සන්නද්ධ අරගලයට සම්බන්ධ වූ සටන්කාමී කණ්ඩායම් ය. පසුව ඔවුන් පාර්ලිමේන්තු පක්ෂ බවට පත් විය. ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (EPDP) සහ ඊළාම් ජනතා විප්ලවවාදී පෙරමුණ (EPRLF) උතුරු හා නැගෙනහිර පළාත්වලින් පාර්ලිමේන්තුව නියෝජනය කරන දෙමළ වාර්ගික පක්ෂ ලෙස ක්‍රියාකාරී වේ.

අහිල ඉලංකෛයි තමිල් කොංග්‍රසය (AITC), තමිල් මක්කල් තේසිය කුට්ටනි (TMTK), ඉලංකෛයි තමිල් අරසු කච්චි (ITAK), තමිල් මක්කල් විදුතලෛයි පුලිකල් (TMVP) සියුම් විෂමතා ආමන්ත්‍රණය කරන ජනවාර්ගික පක්ෂවලට වත්මන් උදාහරණ වේ.

විශේෂයෙන්ම ජනවාර්ගික පක්ෂ ආණ්ඩුවේ පක්ෂ වීමට උත්සාහ කරන විට ඔවුන් අතර සභාග ඇති කර ගැනීමේ ප්‍රවණතාවක් පවතී. දෙමළ ජාතික සන්ධානය (TNA) සහ මුස්ලිම් ජාතික සන්ධානය (MNA) දේශපාලන ප්‍රමුඛතා සමූහයක් පොදුවේ බෙදා ගනිමින් නිර්මාණය වූ සන්ධාන පක්ෂ සඳහා උදාහරණ වේ.




Scanned with CamScanner

**(vi) ප්‍රතිපත්ති චක්‍රය**

මෙම ප්‍රශ්නයේදී චක්‍රීය ප්‍රවාහයක් සහිත ප්‍රතිපත්ති ක්‍රියාවලියේ පියවර විස්තර කෙරෙන ප්‍රතිපත්ති චක්‍රය පිලිබඳ අපේක්ෂකයින් සතු දැනුම සහ එහි අනන්‍ය පියවර පිළිබඳව විස්තර කිරීමට ඇති හැකියාව තක්සේරු කිරීම අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ විවිධ පියවරවල ස්වභාවය සහ ඒ පියවර අතර අන්තර්සබඳතාව ප්‍රතිපත්ති චක්‍රය මගින් විස්තර කෙරේ. ජේම්ස් ලෙස්ටර් සහ ජෝසෆ් ස්ටුවර්ට් ජූනියර් (James Lester and Joseph Stewart Jr.) විග්‍රහ කළ පරිදි, ප්‍රතිපත්ති චක්‍රය චක්‍රීය ගමන් පථයක නැවත නැවතත් ඉදිරියට, පසු පසට මෙන්ම පුනරාවර්ථනය කළ හැකි අදියර හයකින් සමන්විත වේ.




ප්‍රතිපත්ති චක්‍රයේ ප්‍රධාන අදියර පහත පරිදි විස්තර කළ හැකිය.

**න්‍යාය පත්‍ර සැකසීම** යනු ප්‍රතිපත්තියේ කාර්ය පථයට අදාළ විෂයයන් හෝ ගැටළු ලැයිස්තුව පිළිබඳ නිලධාරීන්ගේ මූලික සාකච්ඡාය. මෙම අදියරේදී ආණ්ඩුවේ මැදිහත්වීමක් අවශ්‍ය වන ගැටලුවක් හඳුනාගෙන එය මහජනතාවට ගැටලුවක් ලෙස යෝජනා කිරීම ඇතුළත් වේ.

**ප්‍රතිපත්ති සම්පාදනය** යනු පවතින ගැටලුවක් විසඳීමට හෝ අනාගතයේ ඇතිවිය හැකි අහිතකර තත්වයක් වැළැක්වීමට නීති සකස් කිරීමයි. ප්‍රතිපත්ති සම්පාදන අදියරයේදී න්‍යාය පත්‍ර සැකසීම තුළ අර්ථ දක්වා ඇති ගැටලුවක් මත පදනම්ව අරමුණු හඳුනාගැනීම සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සලකා බැලීම සිදු කරනු ලැබේ.

**ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම** යනු නිර්මාණය කරන ලද ප්‍රතිපත්තිය ආයතන සහ සංවිධාන ආශ්‍රයෙන් ප්‍රායෝගිකව ක්‍රියාවෙහි යොදවන පුළුල් ක්‍රියාවලියයි. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ පහත දැක්වෙන කාරණා ඇතුළත් විය හැකිය,

- ප්‍රතිපත්තිය මගින් ආමන්ත්‍රණය කෙරෙන ගැටලුව විසඳීමේ සඳහා පැහැදිලි විස්තර. නිදසුනක් ලෙස, විසඳුම පිළිබඳ පැහැදිලි අර්ථකථනයක් සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී කුමන සංවිධාන සම්බන්ධ විය යුතුද යන්න.
- ගැටලුව විසඳීමට සම්බන්ධ වන ආයතන සඳහා සම්පත් වෙන් කිරීම පිළිබඳ පැහැදිලි කිරීම, සහ,
- තීරණ ගැනීමේ අධිකාරිය අභිනියෝජනය කර ඇති ආකාරය.



Scanned with CamScanner

**ප්‍රතිපත්ති ඇගයීම** මගින් ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කරයි. එය ප්‍රතිපත්තිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල සහ එම ප්‍රතිඵල වෙත ළඟා වී තිබේද නැද්ද යන්න ඇගයීමට ලක් කරයි. මෙම අදියරයේදී ඇගයීම් ක්‍රියාවලියේ නිගමන සහ ප්‍රතිඵල මත පදනම්ව, න්‍යාය පත්‍ර සැකසීමේ, තීරණ ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් අභිනවයෙන් සැකසීමට තීරණය කළ හැකිය.

**ප්‍රතිපත්ති සංශෝධනය** යනු ප්‍රතිපත්ති ඇගයීමෙන් පසු ප්‍රතිපත්ති වෙනස් කිරීමයි. මෙය ප්‍රතිපත්තියේ ඇතැම් කොටස් වෙනස් කිරීමකට හෝ සම්පූර්ණ ප්‍රතිපත්ති පැකේජයේ සංශෝධනය කිරීමක් හෝ දක්වා පුළුල් විය හැකිය.

**ප්‍රතිපත්ති ඇවර කිරීම** (අවසන් කිරීම) යනු යල් පැන ගිය ප්‍රතිපත්ති හෝ සංශෝධනය කළ නොහැකි ඒවා අත්හැරීමයි.

පහත සඳහන් හේතු නිසා ප්‍රතිපත්ති ඇවර කිරීම සිදුවිය හැක.

- ප්‍රතිපත්තිය තවදුරටත් ඵලදායී නොවීම
- වැඩසටහනේ අවශ්‍යතාවය තවදුරටත් නොපැවතීම.
- අයවැය අවශ්‍යතා සපයා ගැනීම දුෂ්කර වීම ප්‍රතිපත්තියේ හෝ වැඩසටහනේ අවසාන කිරීමකට බල කරයි.
- ඇගයීම් ක්‍රියාවලියක් මගින් ප්‍රතිපත්තිය බලපෑම් සහගත භාවයෙන් අවම හෝ ප්‍රතිඵල සැහීමකට පත් නොවන එකක් බව හෝ තහවුරු වූ විටෙක.
- දේශපාලන පරිසරය තවදුරටත් ප්‍රතිපත්තියක අරමුණු සඳහා සහාය නොදක්වන අවස්ථාවක.
- ඇතැම් ප්‍රතිපත්ති හෝ වැඩසටහන් සහමුලින්ම මතවාදීමය හේතු මත ඇවර කිරීමක් සිදුවේ.

***********

Scanned with CamScanner

## ඇමුණුම් අංක 01

4 (ii) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරබයා අධිකරණයේ භූමිකාව පැහැදිලි කරන්න.

**අරමුණ**

මෙම ප්‍රශ්නයේ ප්‍රධාන ක්‍රියා පදය වන්නේ "පැහැදිලි කරන්න" යන්නයි. යමක් පැහැදිලි කිරීමේදී ශිෂ්‍යයෙකුට තම දැනුම, කුසලතා සහ ආකල්ප පෙන්විය හැක. මේ අනුව මෙය දැනුම සහ සන්දර්භය විශ්ලේෂණය කිරීමට සහ අගයයන් යෝජනා කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරන ප්‍රශ්නයකි.

අයිතීන් මූලික කරගත් දේශපාලන සංස්කෘතියක් සංවර්ධනය කිරීම අරබයා අධිකරණයේ භූමිකාව වැදගත් වන්නේ මන්ද යන්න පිළිබඳ කෙටි හැඳින්වීමකින් අපේක්ෂකයාට පිළිතුර ආරම්භ කළ හැකිය (කෙසේ වෙතත්, හැඳින්වීමක් ලිවීම සඳහා පරමාදර්ශ ආකෘතියක් අපේක්ෂා නොකරන ලෙස පරීක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ).

ප්‍රජාතන්ත්‍රවාදී රටවල, ආණ්ඩුව සහ සෙසු දේශපාලන ආයතන අතර මූලික දේශපාලන සම්මුති ආරක්ෂා කිරීම පිණිස මූලධාර්මික තීරණවලට එළැඹිය හැකි පරිසරයක් නිර්මාණයෙහි ලා අධිකරණය මූලික වන බව පැහැදිලි වේ.

හැඳින්වීමේදී, අපේක්ෂකයාට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂිත ලක්ෂණයක් ලෙස මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි නීතිමය ප්‍රතිකර්ම ඇතුලත් කිරීම සැලකෙන බව සඳහන් කළ හැකිය.

(ලකුණු1)

**අන්තර්ගතය**

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී, මෙන් නොව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 126 වැනි ව්‍යවස්ථාව හරහා මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීතිමය ක්‍රියා පටිපාටියක් සකස් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට අනුව මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ නඩු විභාග කළ හැකි එකම සහ ප්‍රාථමික අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. පුරවැසියෙකුට මානව අයිතිවාසිකම් කඩවීමකදී නීතිමය ආවරණය ලබා ගත හැකි එකම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය බව අපේක්ෂකයින්ට ප්‍රකාශ කළ හැකිය.

විධායක හෝ පරිපාලනමය ක්‍රියාවකින් ඔහුගේ/ඇයගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති විට හෝ උල්ලංඝනය වීමේ අවදානමකට ලක්ව ඇති විට, පිළියම් සහ වන්දි ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට පුද්ගලයෙකුට අයිතියක් ඇති බව ව්‍යවස්ථාවේ දැක්වේ.

17 සහ 126 වගන්ති මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා කඩිනම් සහ සත්‍ය පිළියම් සැපයීම අරමුණු කර ඇත. ඒ අනුව, පුද්ගලයෙකු අයිතීන් උල්ලංඝනය වීමකදී, මාසයක් ඇතුළත ලිඛිත පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

(අපේක්ෂකයාට අයිතීන් උල්ලංඝණය වී ඇති පුද්ගලයා විසින් විනා තුන්වන පාර්ශ්වයකට අයිතීන් උල්ලංඝණය වීමක් පිළිබඳ දින 30ක් ඇතුළත පෙත්සමක් ඉදිරිපත් කළ නොහැකි බව පැහැදිලි කළ හැකිය).

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනෙකුගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් මෙම පෙත්සම ඉදිරියට ගෙන යාමට අවසර දෙනවාද නැද්ද යන්න තීරණය කළ යුතුයි.

පෙත්සම ඉදිරියට ගෙන යාමට අවසර දෙන්නේ නම්, නඩුව විභාග කර මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය සිය තීන්දුව ලබා දිය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි වගන්තිය අනුව, ශ්‍රේෂ්ඨාධිකරණ, එම අයිතිය උල්ලංඝනය වී ඇත්ද, හෝ නැතිද යන්න හෝ පෙත්සම්කරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ අවදානමක් තිබේද යන්න තීරණය කළ යුතුය.

ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ මූලික අයිතිවාසිකම් නඩු පැවරීම සහ නීතිමය ප්‍රතිකර්ම ලබා ගැනීමේදී ඇති අභියෝග හෝ බාධාවන් ලෙස පහත කරුණු සාකච්ඡා කළ හැක.



www.e-kalvi.com

Scanned with CamScanner

- මූලික අයිතිවාසිකම් කඩවීම පිලිබඳ නඩුවක් ගොනු කිරීමට ලබා දී ඇති කාල සීමාව ප්‍රමාණවත් නොවන බව.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු ගොනු කිරීම මිල අධික වන බැවින් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සාමාන්‍ය ජනතාව අභියෝගවලට මුහුණ දීම.
- අධිකරණ ක්‍රියාපටිපාටියේ දීර්ඝ ප්‍රමාදයන් සිදුවීම සහ තීන්දුව ලබාදීමට වසර ගණනාවක් ගත වීම.
- අධිකරණ ක්‍රියාවලියට දේශපාලන මැදිහත්වීම්
- දුරස්ථ සහ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන අයට ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රවේශ වීම දුෂ්කර ය.
- මූලික අයිතිවාසිකම් කඩවීම පිලිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීම සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැතිකම
- ආයතනික, මානව සහ අනෙකුත් සම්පත් හි හිඟ කම්. (ලකුණු 8)

සුවිශේෂී අවස්ථා වලදී, අපේක්ෂකයෙකු ඉහත සඳහන් කර ඇති කරුණු ඉක්මවා අධිකරණයේ කාර්යභාරය සාකච්ඡා කළ හැකිය. යෝජිත නීතිවල ව්‍යවස්ථානුකූලභාවය තීරණය කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්යභාරය, මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ නඩු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමේදී අභියාචනාධිකරණයේ කාර්යභාරය, සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඔවුන්ගේ තීරණ සහ අර්ථකථන හරහා මූලික අයිතිවාසිකම් පුළුල් කර හෝ ගිවිසුම්ගත කර හෝ ඇති ආකාරය වැනි දෑ නිදසුන් ය.

(එවැනි පිළිතුරු වෙතොත්, සම්පූර්ණ ලකුණු වෙන් කරන ලෙස, ලකුණු කිරීමේ පරීක්ෂකවරුන්ට උපදෙස් දෙනු ලැබේ).

**නිගමන.**

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාව තුළ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය කෙතරම් දුරට කැපවී ඇත්ද යන්න සහ එහි බලපෑම් අපේක්ෂකයින්ට ප්‍රකාශ කළ හැකිය. අන්තර්ජාල ආරක්ෂණ පනත් කෙටුම්පත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ පළාත් පාලන මැතිවරණය කල් දැමීම යනාදී මූලික අයිතිවාසිකම් පිලිබඳ කාරණා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පසුගිය කාලය තුළ ලබා දුන් ඇතැම් තීන්දු සම්බන්ධයෙන් ද අපේක්ෂකයින්ට සාකච්ඡා කළ හැකිය. එසේම බොහෝ අවස්ථාවලදී මූලික අයිතිවාසිකම් කඩ වූවන්ට පුද්ගලිකව වන්දි ගෙවන ලෙස වග උත්තරකරුවන්ට නියෝග කරන බව ප්‍රකාශ කළ හැකිය.

(ලකුණු 1)

www.e-kalvi.com

Scanned with CamScanner